# පින් ලබන ප්‍රේතයින්

සම්පාදක
අග්ග මහාපණ්ඩිත කොටුගොඩ
ධම්මාවාස මහානායක ස්ථවිර

# පින් ලබන ඥාතීන්

© : පූජ්‍ය කොටුගොඩ ධම්මාවාස මහානායක ස්ථවිර

ධර්ම දානය පිණිස පමණි.

ධර්ම දානය සඳහා මුද්‍රණ විමසීම්.

මුද්‍රණය

දිමුතු මුද්‍රණාලය

අංක 103/A, නුවර පාර, යක්කල.

දුරː 033-2239662 / 077-8829705

විද්‍යුත් තැපෑලː dimuthupub@yahoo.com

දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.

වෙබ්ː www.dhammadanabooks.com

# පෙරවදන

ලෝකයේ ඒ ඒ ආගම් අදහන භවතුන් තම තමන්ගේ ආගම්, චාරිත්‍රානුකූලව මිය පරලොව ගිය ඥාතිමිත්‍රාදීන් සිහිපත් කොට විවිධාකාර පිංකම් කෙරෙති, ලෝකය පුරා විසිරී සිටින බෞද්ධ ජනතාව බුදු දහමේ එන සිරිත්-විරිත් අනුව මියගිය භවතුන් වෙනුවෙන්, තම තමන්ගේ ඥාතිත්වයන් ගැන සලකා, කුසල ක්‍රියාවන්හි යෙදී ඒ පුණ්‍ය බලයෙන් මියගිය ඥාතීන්ට බොහෝවිට නම් ගම් සිහිපත්කොට පිංදීම සිරිතය. එදා බුදුන් දවස බිම්බිසාර මහරජතුමා දුටු සිහිනයකට අනුව ඥාතීන්ට පිංදීම බුදුරදුන් දවස අනුමත කළ බව සඳහන් වේ. එදා බුදුරදුන්ගේ අනුශාසනා පරිදි බිම්බිසාර මහාරාජයා පිං අනුමෝදන් කළේ කල්ප ගණනාවකට පෙර සිට දුගතියට පත්ව සිටි තම ඥාති පිරිසක් දුකින් ගලවා සුගතියට පත් කරනු සඳහා ය.

ඥාතීන්ට පිංදීමේ එකී චාරිත්‍රය බෞද්ධ ලෝකයා විසින් අද දක්වා ම පවත්වාගෙන එති. ප්‍රමුඛ වශයෙන් ම කෙරෙන්නේ සඟසතු දානමය පුණ්‍ය ක්‍රියාවක්කොට එම පුණ්‍ය බලයෙන් මිය ගිය අයට අනුමෝදන් කරවීමය. සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාට ආරාධනා කොට වැඩම කරවාගෙන ඉඩකඩ ඇති පරිදි වියදම් කළ හැකි පරිදි සංඝයා වහන්සේට දම් පහන් පුදා පිං අනුමෝදන් කිරීම එම ඥාතීන්ට පිංදීමේ සිරිත වශයෙන් පවත්වා ගෙන එති. ඒ අතර දුගී මගී යාචකාදීන්ට ද, ගව, බලු, කපුටු ආදී සතුන්ට ද ආහාර පාන වලින් සංග්‍රහ කොට පිංදීම ද සිරිත ය.

චීවර පිණ්ඩපාත, සේනාසන, ගිලානප්‍රත්‍යය යන සතර කොටසට අයිති ප්‍රත්‍ය දානයන් පිරි නැමීම අපගේ චාරිත්‍රයයි. ඒ අනුව ඥාතීන්ට පිංදීමේ ගුණාංගය, පිළිබඳව අනුමාතෘකා 13ක් යටතේ මේ කුඩා ග්‍රන්ථය සකස්කොට ඇත. එහි ඇති කරුණු මැනවින් කියවා බලා ඥාතීන්ට පිං ලැබෙන ආකාරයෙන් ම පිං අනුමෝදන් කිරීමට සැම කෙනෙකුන් විසින් ම පුරුදුවිය යුතුය. එය මිය ගිය ඥාතීන්ට සැනසිල්ලක් වීමට හේතු වන්නේ ය එසේම තමන්ට ද එය මහපිනක් ලැබෙන කුසලයක් බව සැලකිය යුතුය. මෙම කුඩා දහම් පොත් මුද්‍රණය කොට ධර්ම දානයක් වශයෙන් පරිත්‍යාග කිරීම කුසලයක් බව සඳහන් කළ යුතු වන්නේ ය.

සියලු සත්වයෝ නිදුක් වෙත්වා.!

මෙයට,

**මහෝපාධ්‍ය අග්ගමහා පණ්ඩිත කොටුගොඩ ධම්මාවාස මහානායක ස්ථවිර.**

# පටුන


01. කාසි පුරය 06

02. දැඩි ප්‍රකාශයක් 08

03. වස් සාරමසක් 11

04. ඉඳුල් කිරීම 13

05. තුන් බෑ ජටිලයෝ 14

06. නපුරු සිහිනයක් 17

07. නෑකමේ දැඩිබව 21

08. සැරියුත් තෙරණුවෝ 24

09. දෙවඟනකගේ උපකාරයක් 27

10. දෙන පින් ලබන්නෝ 34

11. නිවැරදිව පින්දීම 37

12. තිරොකුඩ්ඩ සූත්‍රය 41

13. සතුන්ට පින් දීම 46

# පින් ලබන ඥාතීන්

## නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

සම්මා සම්බුදුරජාණන් වහන්සේ අසීමිත කාලාන්තරයක් දස පාරමිතා ධර්මයන් පුරන සේක් ! ලෝක සත්වයා සාංසාරික දුකින් එතෙර කරවීමට පමණක් නොව - සසර ගමනේ දී උපදින උපදින ආත්ම භාවයක් පාසා ම, ඔහුට හෝ ඇයට සහනසීලී සැපවත් ජීවිතයක් ගත කරනු සඳහා අවස්ථාවන් සලසා දීම පිණිසත් ය. සැපවත් ජීවිතයක් ගත කරන පුද්ගලයාට සහනශීලී බවක් තිබෙන නිසා හොඳ නරක තේරුම් ගැනීමේ හැකියාව ලැබෙන්නේ ය. එමගින් ඔහුගේ හෝ ඇයගේ බුද්ධිමත් බව ද, වඩා පැහැපත් කරගත හැකිය. ඒ තත්වයට පත් වූ පුද්ගලයා පාපයට බර නොවන්නේ ය. කුසලයට - ගුණයට නැඹුරු වන්නේ ය. එහෙයින් ම ගුණය - ගුණය වශයෙන් ම කුසලය - කුසලය වශයෙන් ම, මසැසින් පමණක් නොව නුවණැසින් ද මනා ලෙස දකින්නේ ය. කළ යුතු දේ කුමක් ද? යන්න තේරුම් බේරුම් කොට ගෙන නොකළ යුතු දෙයින් වැළකී, කළ යුතු දෙය ම කරන්නේ ය. බුදුරදුන් වාදාරන ලද මාර්ගයත් එයමැයි.

**බුද්ධෝහං බෝධයිස්සාමි - මුත්තෝහං මෝචයේ පරේ**
**තිණ්ණෝහං තාරයිස්සාමි - සංසාරෝසා මහබ්භයා**

'' මම ධර්මය නිසිපරිදි අවබෝධ කොට ලෝකයාට ද ඒ ධර්මය නිසි පරිදි අවබෝධ කරවන්නෙමි. මම නැවත නැවත උපත ඇති කරවන ලෝභය, ද්වේශය, මෝහය මුල් කොට පහළ වන පාපකාරී සිතිවිලි වලින් නිදහස්ව, ලෝක සත්වයා ද ඒ පාපකාරී සිතිවිලි වලින් මුදවා ගන්නෙමි. නැවත - නැවත උපත ඇති කරවන ගති පැවතුම් වලින් වැළකී ලෝක සත්වයා අති භයානක වූ සංසාර නැමති සාගරයෙන් එතෙර කරවන්නෙමි'' යන ඉහත සඳහන් ගාථාවෙන් දැක්වෙන සම්‍යක් අධිෂ්ඨානයෙන් යුතුවම ගුණනුවණ වැඩු සේක. බුදු

බවට පත්වීමෙන් පසුවද ලෝකයාගේ පරලොව පමණක් නොව එනම්, මතු භවයන් ගැන පමණක් නොව මෙලොව යහපතටද හේතුවන අයුරින් ම ධර්ම දේශනා කළ සේක. තමන් වහන්සේගේ උත්තරීතර පැවැත්ම ද අන් අයට ආදර්ශවත් වන අයුරින් ම ගත කළ සේක. ඒ ධර්ම ගත කරුණු අනුව බලන විට භාග්‍යවතුන් වහන්සේ මියගිය තම ඥාතීන් වෙනුවෙන් ද කුසලයන් කොට පින් දියයුතු ආකාරය පැහැදිලිව ම වදාරා ඇත.

සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායයෙහි ප්‍රේත වත්ථු වර්ණනාවට අයත් උරග වර්ගයෙහි එන පස් වැනි වූ තිරොකුඩ්ඩ සූත්‍ර ප්‍රේත වර්ණනාව පිළිබඳ නිවැරදිව දැනගත යුතුය. එය මියගිය ඥාතීන්ට පිංදීම පිළිබඳව පැහැදිලි විස්තරයක් ඉදිරිපත් කරනු ලබන ශ්‍රී මුඛ දේශනාවක් වන බැවිනි. මෙතැන් සිට ඒ කතා ප්‍රවෘත්තිය පැහැදිලිව දක්වන බව සැලකිය යුතුයි.

## කාසි පුරය

මෙයින් පෙර, අනූදෙවැනි කල්පයෙ හි දඹදිව අගනුවර බවට පත්වූයේ කාසි පුරය යි. එම නගරය දිගින් ගව් දෙතිසක් වූයේ ය. පළලින් ද ගව් දෙතිසක් විය. මේ අනුව ගව්වකට සැතපුම් සතරක් බැවින් සැතපුම් එකසිය විසි අටකි. පළලින් ද මේ මහා නගරය සැතපුම් එකසිය විසි අටක්ම විය. කුඩා රටක් හා සමාන විශාලත්වයකින් යුත් සුවිශාල ජම්බු ද්වීපයට අයත් මේ නගරයෙහි, රටේ ධනවත්, බලවත්, නැණවත්, පින් ඇති, බොහෝ දෙනා ජීවත් වූවෝ ය. මේ කාසි නගරයෙ හි මහා මාර්ග - අනු මාර්ග එයිනුත් තවතවත් අතුරු මාර්ග කුඩා මං මාවත් හැට හැත්තෑ දහස් ගණනකට වැඩි ය. නගරය වටා කැරකී මහා සමුද්‍රය කරා ගලා බසින සුවිශාල කාසි මහා ගංගාවෙන් හා ඇළ දොළ මගින් නගරය තුළ විහිදී ගිය ජල මාර්ග නිසා මෙනුවර අලංකාරවත් විය. මනා ලෙස වැඩුණු ගස් කොළන් වලින් සෙවණ සපයා දීම ද නො අඩුව සිදුවිය. එදා පාරම්පරික චාරිත්‍රයක්ව පැවති, සෑම නිවසකටම අයත් වූ

ගෙවතු වල එළවළු, පලතුරු, මල්වර්ග සහ ඖෂධීය භෝග වගාවන් සශ්‍රීක බවට පත් වූයේද - කාසි මහ ගංඟාවෙන් පැතිර ගිය මේ ඇළ දොළ මාර්ගවලිනි. එනිසා නගර වාසීහු ප්‍රසන්න සිත් ඇත්තෝම වූහ.

ඔවුහු ඈත ගම් නියම් ගම් වලින් එන භවභෝග දෙස ම බලාගෙන නොසිටියහ. තම තමන්ගේ ගෙවතු වලින් ලද සම්පත් නිසා නිරෝගිතාවයත් - ශරීර සෞඛ්‍යයත් දියුණු කරගත්හ. එයට වඩාත් හේතු වූයේ සෑම නිවසකම වාසනාව ගෙනදෙන කිරි එළදෙනක් ද සිටීමයි. ඉවසීම, කරුණාව ඔවුන් තුළ වැඩිදියුණු වීමට ද එය ප්‍රමුඛ හේතුවක් විය. මේ මහා කාසී නගරය හැරුණු විට දඹදිව ඒ ඒ පළාත් වල වැඩි ප්‍රමාණයක් පැවතියේ කෙත්වතු සහ ගම් නියම්ගම් ය. අලි,කොටි,වග වලස්, සිංහ ආදී සතුන්ගෙන් පිරීගිය වනාන්තරයෝ ද වූහ. ඒ නිසා එදා දඹදිව අතිවිශාල රටකි. එකී රට අද ඉන්දියාව, පාකිස්ථානය, භූතානය, නේපාලය, බංගලාදේශය, ටිබෙටය ආදී විවිධ රාජ්‍ය වලට වෙන් වී ඇත. එදා මෙකී මහා දඹදිව් රාජ්‍යයේ අගනුවර බවට පත්වූයේ ඉහත සඳහන් කළ කාසි රාජධානියයි.

දඹදිව් තලයෙහි මහා නගර - අනු නගරවල ප්‍රාදේශීය රජවරු රාජ්‍යය විචාළෝය. ඔවුහු සියල්ලෝම රටේ මහා රාජධානියෙහි එනම්, කාසිපුර ජයසේන මහාරාජයාගේ අණසක යටතේ නිදහසේ තම තමන්ගේ රාජ්‍යයන් පාලනය කළහ. වාර්ෂිකව ජයසේන මහරජතුමාට තුටු පඬුරු වශයෙන් ධනධාන්‍යය සහ සම්පත් යැවූහ. මේ නිසා මුළු දඹදිව් තලයම සාමයෙන් සමාදානයෙන් ගත වූ ආකාරය පැරණි පොත පතින් පැහැදිලි වෙයි. එහෙත්, තම තමන්ගේ අරමුණු ඉටු කරගැනීම පිණිස ඇතැම් ජනප්‍රධානීහු, වැසියන් නොමග යවා අර්බුද ඇති කළ අවස්ථාවන් ගැන ද සඳහන්ව ඇත. කාසි රජතුමාද ගුණවත් නැණවත් ප්‍රතාපවත් අභිමානවත් සත්‍යවාදි මහීපාලකයෙකි. රාජකීයත්වය එතුමා තුළ සියයට සීයක්ම පූර්ණ ලෙස පැවතුනි. එනිසා රටවැසියෝ ද ප්‍රත්‍යයන්ත රජවරුද ජයසේන මහරජතුමාට දක්වන ලද්දේ ගෞරවණීය, පූජනීය තත්ත්වයකි. කලාතුරකින් ඇතිවන අරගලයක් වුවද තම ආඥාවේ බලයෙන් සන්සුන් කිරීමේ ශක්තිය එතුමා තුළ

පැවතිණ.

දසරාජ ධර්මයෙන් රාජ්‍ය විචාළ, පිනෙන් පිරුණු ජයසේන මහරජතුමාගේ අගමෙහෙසිය බවට පත් සිරිමා දේවිය ද එවැනිම රටේ පිළිගත් උත්කෘෂ්ට රජ පවුලකින් පැවත ආ පංචකල්‍යාණයෙන් සපිරුණු කුමාරිකාවක් ම වූවාය. මේ මහා පිනැති ජයසේන මහා රාජයා නිසා එබඳුම මහ පිනැති සිරිමා බිසවගේ කුසින් ඵුස්ස නම් මහ බෝසතාණන් වහන්සේ උපත ලදහ. පිරූ පාරමිතා ධර්මයන් ඇති ඒ මහ බෝසතාණන් වහන්සේ, නිසි වියට පත්ව ගිහිගෙය හැරපියා සම්මා සම්බුදු බවට පත් වූ සේක. තම පුතණුවන් වහන්සේ බුදු බවට පත් වීම නිසා මහත්සේ සතුටට පත් ජයසේන පිය රජතුමා ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ සිවු පස පහසුව රජ ගෙදරින් ම කළ යුතු යැයි අධිෂ්ඨාන කොට ගෙන බුදුරදුන් වෙනුවෙන් සියලු උවටැන් රජු විසින් ම සලසන ලද්දේය.

## දැඩි ප්‍රකාශයක්

ජයසේන මහ රජතුමාට අනෙක් බිසවක කුසින් උපත ලද පුණ්‍යවන්ත කුමරුවෝ තිදෙනෙක් ද වූහ. ඔවුහුද රජුගේ ආමාත්‍ය මණ්ඩලයේ ම සේවය කරන රජුට සහාය වන ඇමතිවරු තුන්පලකි. ඒ පුතණුවරුන් තුන්පල සහ මැති - ඇමතිවරුන් අතර ද, ප්‍රදේශීය පාලකයන් සහ ප්‍රත්‍යන්ත රජවරුන් අතර ද රටේ ප්‍රභූ ජනතාව තුළ ද කල්ගත වෙත්ම, ජයසේන මහා රාජයා කෙරෙහි කලකිරීමක් ඇතිවිය. එයට හේතුව රජු පමණක් ම බුද්ධෝපස්ථානය - සංඝෝපස්ථානය අනෙකෙකුට ඉඩ නොදී සිදුකිරීමයි.

මේ කරුණු පිළිබඳව රජ කුමාරවරුන් තුන්පල සහ ප්‍රභූ ජනයා නොයෙක් අවස්ථාවන්හිදී පිය මහ රජුට ඇවිටිලි කළෝ - තමන්ට ද පොදු මහ ජනතාවට ද ඵුස්ස ලොව්තුරා බුදුරජාණන් වහන්සේට දන් පහන් දීමට, ඇප උපස්ථාන කිරීමට අවස්ථාව ලබා දෙන ලෙසයි. ඒ සෑම වාරයකදී ම ජයසේන රජතුමා තරයේම කියා සිටියේ දරුවෙනි, ''බුදුරජාණන් වහන්සේ මාගේ ම පුත්‍රයෙකි. එනිසා බුදුරදුන්

මගේ ය. ධර්ම රත්නය ද මගේම ය. ශ්‍රාවක සංඝ පිරිස ද මගේම ය. මේ අනුව දරුවෙනි, බුද්ධ රත්නයත්, ධර්ම රත්නයත්, සංඝ රත්නයත් මගේමැයි. මා ජීවත් වන තුරු - ත්‍රිවිධ රත්නය රැක බලා ගැනීමේ අයිතිය ඇත්තේ මටයි. එබැවින් බුදු රදුන්ටත්, ශ්‍රාවක මහා සංඝයා වහන්සේටත් මා විසින් ම ඇප උපස්ථාන කළ යුතුවා මිස, තවත් කෙනෙකුට එය පැවරීමට මගේ කැමැත්තක් නැත. එමනිසා මේ ඉල්ලීම නැවත මා වෙත ඉදිරිපත් නොකරව යි'' කියා සිටියහ.

රජුගේ ඉහත සඳහන් දැඩි ප්‍රකාශයෙන් කුමරුවෝ කලකිරීමට පත්වූහ. අනෙකුත් මැති ඇමතිවරුන් සහ ඉහළම පෙලේ ප්‍රත්‍යන්ත රජවරුන් කිහිප දෙනෙකු හා රහසිගතව සාකච්ඡා පවත් වන්නෝ ''පිය මහ රජාණන් වහන්සේගේ මේ අදහසට අපට එකඟ විය නොහැකිය. අපිදු බුදු රදුන්ගෙන් බණ ඇසීමෙන් ම පමණක් සෑහීමකට පත් නොවී, උන්වහන්සේට ඇප උපස්ථාන ද කළ යුතුය. අපටත් ඒ වරප්‍රසාදය තිබිය යුතුය. ඒ සඳහා උපායක් යොදමු'' යැයි කතිකා කොට ගෙන අගනුවරින් රටේ ඈත ප්‍රත්‍යන්ත දේශයන් දෙක තුනක වාර්ෂිකව රජතුමාට ගෙවිය යුතු අයබදු නතර කරලු හ. රට වැසියෝ ද මහත් සතුටින් කුමරුවන් තිදෙනාගේ සහ ප්‍රත්‍යන්ත රජ - වරු කීප දෙනාගේ අදහසට බලවත් සේ සහයෝගය දුන්හ. එයට හේතුව ඔවුන්ගේ බලාපොරොත්තුව ද, බුදුරදුන්ට උවටැන් කිරීමේ ඉඩකඩ සලසා ගැනීමට පැවැති ආශාවයි. වසරක් හමාරක් ගත වෙත්ම රජතුමාට මෙය දැනුණේ - රාජ්‍ය භාණ්ඩාගාරය කෙමෙන් හිස් වේගෙන යාම නිසාය. සොයා බැලූ විට රජුට දැනගන්නට ලැබුනේ රජතුමා පිළිබඳව ජනතාව කළකිරී අයබදු නොගෙවන බවයි. මෙයින් කම්පිත පවට පත් ජයසේන මහ රජතුමා තම පුතණුවන් තුන්පොල කැඳවා සාකච්ඡාවක් කළේ ය.

''දරුවෙනි, තෙපි තිදෙනාම මාගේ පුතණුවරුය. අනෙක් පැත්තෙන් බලන විට මාගේ අමාත්‍ය පදවි දරන තිදෙනෙක් ද වෙති. ප්‍රත්‍යන්ත දේශ කීපයක ජනතාව මා කෙරෙහි කළකිරී අයබදු ගෙවීම් අත්හැර ඇත. ඒ ප්‍රදේශ වලට අයත් රාජ්‍ය භාණ්ඩාගාර අංශයන් හි මුදල් අංශ හිස් වේගෙන

යයි. ඒ දේශවල ජනතාවගේ උන්නතිය පිණිස ඇළ, දොළ, වැව්, පොකුණු මං මාවත්, ගිලන් ශාලා, වැඩි දියුණු කිරීම පිණිස - දුෂ්කර ප්‍රදේශවලට ආධාර යැවීම පිණිස නියම කළවිට - රාජ්‍ය භාණ්ඩාගාරයට මගේ නියමයන් ඉටු කිරීමට අපහසු බව එය භාර අමාත්‍යවරයා දැනුම් දී තිබේ. ඔබ තුන්පොල වහා ඒ ඒ දනව්වලට ගොස් ප්‍රත්‍යන්ත රජවරු කීපදෙනා සමඟ ද සාකච්ඡා කොට සාමය ඇති කළ යුතුයැයි'' උපදෙස් දී කුමාරවරු තිදෙනා පිරිවර සහිතව ප්‍රත්‍යන්ත දේශයන් බලා යැවූහ. ඔව්හු ද තමන් විසින් ම යෙදූ උපායක් බැවින් මහරජුට කිසිවක් දැනගත නොහැකි වන අයුරින් ඒ ඒ ප්‍රදේශ වලට ගොස් ජනතාව සාමකාමී බවට පත් කරවා මාස ගණනාවකට පසු කාසී නගරයට පැමිණ රජතුමාට වාර්තා කළෝ ය.

මහ රජතුමා කියනුයේ - ''දරුවෙනි, තෙපි කරුණු පහදා දී ගහ බැන ගැනීමකින් තොරව - ලේ වැගිරීමකින් තොරව සාමය ඇති කිරීම ගැන සතුටට පත්වුනෙමි. තෙපි තිදෙනා මගේ දරුවෝ ය. වගකිවයුතු අමාත්‍යවරු ය. මා කෙරෙහි සෙනෙහැති රාජ්‍ය පාක්ෂිකයෝ ය. ඒ දනව් වැසි මහ ජනතාවද මා සලකන්නේ මාගේම දරුවන් හැටියටයි. අපේ රාජ ධර්මය එයයි. තම දරුවනට සේම රටවැසි ජනතාවටද ස්නේහවන්තව පිළිපැදිය යුතු බව රාජ ධර්මයක් වේ. ඒ අනුව තෙපි තිදෙනා ජනතාවගේ සිත් සතන් දිනා ගනිමින්, රටේ මහරාජයා වශයෙන් මා කෙරෙහි ද ඔවුන්ගේ ඇති ගෞරවාන්විත පිළිගැනීමට හානියක් නොවන අයුරින් මේ බැරෑරුම් ප්‍රශ්නය විසඳා ඇත. තව ටික දවසක් ගත වූවා නම් මේ අර්බුදය මාගේ පාලනය යටතේ පවත්නා අනෙකුත් ප්‍රත්‍යන්ත රාජ්‍ය වලටද පැතිරී යාමට ඉඩ තිබුණි. එයද දැන් වැළකී ඇත. මේ ඉටුකළ උදාර රාජ පාක්ෂික සේවාව අගය කරමින් මවිසින් ද තෙපි තිදෙනා ඇතුළු මේ ප්‍රශ්නය නිරාකරණය කර ගැනීමට සහාය දුන් නිල දරුවනට ද විශේෂ සැලකිල්ලක් කළ යුතුවමම ඇත. එයත් අපගේ කෘතෝපකාරී රාජ්‍ය නීතියකි. ඔබ තුන් පොලට අවශ්‍ය ඕනෑම වරයක් - ඉල්ලීමක් ඉදිරිපත් කරව. එය ඉටු කිරීමට අපේ රාජ නීතිය අනුව මම බැඳී සිටිමි.''

මේ පිළිතුරෙන් කුමරුවන්ට ඉමහත් සතුටක් ඇති විය. තමන් යෙදූ උපායශීලි ක්‍රියා මාර්ගය පිය රජතුමාට දැනගැනීමට ඉඩ නොතබා, තමන් කළ හපන්කම ගැනද ඔවුන් ආඩම්බරයට පත්වූහ. ඊට පසු දින මේ තිදෙනාම පිය මහරජාණන් වහන්සේ දැක ආචාර සමාචාර දක්වා ''පියමහරජතුමනි, ඔබ වහන්සේ අප ධෛර්‍යවත් කරමින් - අපගේ සේවය අගය කරමින් කළ ප්‍රශංසාත්මක දේශනය ගැන ඉමහත් ලෙස සතුටු වෙමු. ඒ ප්‍රකාශනය ගැන අපි සහෝදරවරු තුන්පලද ඔබ වහන්සේ දීමට පොරොන්දු වූ වරය පිළිබඳ සාකච්ඡා කළෙමු. පිය මහරජාණන් වහන්ස, අප ඉල්ලන වරය නම් අන් කිසිවක් නොවෙයි. අපේ සහෝදර ඵුස්ස බුදුරජාණන් වහන්සේට සත් අවුරුද්දක් ඇප උපස්ථාන කිරීමට අනුමැතිය ලබා ගැනීමයි.'' ''දරුවෙනි, ඔය ඉල්ලීම හැර වෙනත් කවර වරයක් හෝ ඉල්ලීම හොඳයි. බුද්ධෝපස්ථානය නම් මා ජීවත් වනතුරු මවිසින් ම කළ යුත්තකි.'' ''පිය මහරජතුමනි එසේ නොකියනු මැනවි. එසේ නම් සය අවුරුද්දක් දුන මැනව.'' ''දරුවෙනි, එයද නොකල හැකිය.'' මේ අනුව පස් අවුරුද්ද, සිවු අවුරුද්ද, තුන් අවුරුද්ද, දෑ අවුරුද්ද, එක් අවුරුද්ද, දක්වාද අඩු කොට බැරිම තැන සත් මසක්ද, සය මසක්ද, පස් මසක්ද, සිවු මසක් දැයි කියා බලවත් සේ ඇවිටිලි කොට ඉතා අමාරුවෙන් හාර මාසයකට අනුමැතිය ලබා ගත්හ. ''එසේ නම් දරුවෙනි තොපගේ මේ බලවත් ඉල්ලීම ඉවතලිය නොහැකි නිසාත්, අන් කිසිවක් තෙපි බලාපොරොත්තු නොවන නිසාත් ඉදිරි වස් කාලය බුදුරජාණන් වහන්සේට ආරාධනා කොට උන් වහන්සේගේ අනුමැතිය පරිදි ඉෂ්ට කර ගනුව'' යි, අවසර දුන්නේ ය.

## වස් සාරමසක්

කුමාරවරු තිදෙනාද සිහසුනට පත් වූවක් මෙන්, මහත් සේ සතුටුව ඵුස්ස බුදුරදුන් වෙත ගොස් මෙපුවත් සැළකොට ඉදිරි වස් කාලය තුළ ඇප උපස්ථාන කිරීම සඳහා අවසර ලබාගත්හ. මහත්සේ ප්‍රමුදිත බවට පත් වූ මේ කුමාරවරු

තිදෙන තමන්ගේ ප්‍රධාන කාර්යයභාරයන්හි නියුක්ත පිරිස කැඳවා ඉදිරි වස් කාලය තුළ බුදුරජාණන් වහන්සේටත්, මහා සංඝයා වහන්සේටත් විහාරාරාමාදිය ඉදි කිරීමට සැලසුම් කළහ. ඒ අනුව ජල පහසුකම් සහ නිසි ලෙස වැඩුණු ගස් කොළන් ඇති භූමි භාගයක් තෝරා එහි සමවූ බිම් කොටසක බුදුරජාණන් වහන්සේ වෙනුවෙන් සුවිශේෂ ගන්ධ කුටියක්ද, මහා සංඝයා වෙනුවෙන් සුවිශාල ආරාමයක් ද ඉදි කරවා ඊට අදාළ දාන ශාලා, සක්මන් මළු, පැන් පොකුණු, වච්ච කුටි ආදිය ද ඉදිකොට නිම කළහ. රටේ ජනතාව ද බොහෝ කාලයක සිට බලාපොරොත්තු වූ පැතුමක් ඉටුවීම නිසා ඉමහත් උනන්දුවකින් යුතුව මේ සියලු කටයුතු වහා නිම කර ගැනීමට කුමාරවරුනට මහත්සේ උපකාර කළහ. රාජකාරී කටයුතු පිළිබඳව මනා පුහුණුවක් ඇති කුමාරවරු වස් තෙමස හා කඨින මාසය තුළ දිනපතා හීල් දානය හා දහවල් දානය පිළියෙළ කිරීම පිණිස තෝරාගත් දස දහසක් පිරිස අතුරෙන් එක් කණ්ඩායමකට බාර කළහ. ඔවුනට අවශ්‍ය සියලු පහසුකම් ද සේවක කාරකාදීන් සම්බන්ධ කොට ගෙන දානයට අවශ්‍ය ධාන්‍ය වර්ග එළවළු, පලතුරු, කුළුබඩු, සහ කැවිලි - පෙවිළි, ආදිය නිතිපතා ලැබෙන සේ අවශ්‍ය විධිවිධානයන් ද යෙදූහ.

ගිලන්පස පිළියෙළ කිරීම් සහ ජල සැපයීම් ආදී කටයුතු වලට ද පවිත්‍රතා කටයුතු වලට ද තවත් පිරිසක් යෙදවූහ. මේ අතර මහ සඟ පිරිසක් සහිත බුදුරදුන් වැඩ සිටිනු ලබන විහාරස්ථානයකට උන්වහන්සේ දැකීමට බණ පිරිත් ඇසීමට සංඝෝපස්ථානාදී කටයුතු වලට නිමක් නොමැතිව සෙනඟ පැමිණෙන බැවින් ඔවුනට අදාළ පහසුකම් සැලසීමට ද තවත් පිරිස් යොදවන ලදහ. මේ චිත්තාකර්ශනීය විහාරස්ථානයට නිතිපතා පැමිණෙන්නෝද එලෙසම නිමක් නැති තරම් විය. මේ සෑම කාර්ය සම්භාරයක් සඳහාම පත් කරන ලද ප්‍රමුඛ පුද්ගලයා වූයේ ඒ ජනපදයෙහි අධිපතිවරයා ය. මෙසේ ඇසළ පුර පසළොස්වක පොහෝ දින බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේ වස් සමාදන් කරවන ලදහ. නගරයේ පමණක් නොව ගම් දනව් වැසියනුත් ඵුස්ස බුදුරදුන් ප්‍රධාන

මහා සඟරුවනට ඇප උපස්ථාන කිරීමට ලැබීමත් නිසා මහත් සේ ප්‍රමුදිත බවට පත්වූහ.

## ඉඳුල් කිරීම

මෙසේ අපරිමිත පරිශ්‍රමයකින් යුතුව ජයසේන පිය මහ රජාණන්ගෙන් ලබාගත් වරය අනුව පින්කම නිසි පරිදිම ඉටුකොට අනුහස් ලබා ගැනීම සඳහා කුමාරවරු තුන් පලද සමත් වූහ. වස් කාලය තුළ බුද්ධප්‍රමුඛ මහා සංඝයා වහන්සේට නිරන්තරයෙන්ම උවැටන් කිරීම පිණිස තෝරාගත් සැදැහැවත් දස දහසක් පමණ පුරුෂයන් සමඟ කුමාරවරුද ගුරු පාට වස්ත්‍රයෙන් සැරසී උපෝසථ අෂ්ඨාංග ශීලයෙන් යුතුවම පිළිවෙත් පිරූහ. ඔවුන්ගේ භාණ්ඩාගාරික පුරුෂ තෙමේ දානමය කටයුතු ඉහත කී පරිදි තම පිරිසත් සමඟ නිසි පරිදිම ඉටු කළහ. මේ අතර කුමරුවන්ගේ නියමය පරිදි දානමය කටයුතු බාරගත් පිරිසට අයත් ඇතැම් දෙනා මාසයක් හමාරක් ගත වූ විට පළමුව පැවති සැදැහැවත් බවින් තොරව පිළියෙල කළ දානය බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට පිදීමට පෙර උඩින් පල්ලෙන් ඉඳුල් කරන්නට පටන් ගත්හ. ටික දවසක් ගත වෙත්ම රසවත් ආහාර වලට ඇලුණු ඔව්හු, නිබඳව ම සංඝ දානයට පෙර බිය සැක නැතුවම හොරෙන් කෑමට පවා උත්සුක වූහ. එසේම දානයෙන් පසු ඉඳුල් අතන මෙතන දමා දාන ශාලාදිය ද අපිරිසිදු කිරීමට පටන් ගත්හ. දානයට පෙර අතිශ්‍රේෂ්ඨ වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේටත්, මහරහතන් වහන්සේටත්, පිළියෙළ කළ ආහාර පාන අනුභව කිරීමට පටන් ගත් මේ කෑදර පිරිස - කඨින පින් කමෙන් පසු රණ්ඩු සරුවල් ඇතිකරගෙන දාන ශාලාවට ද ගිනි තැබුවෝය. මිනිස් ගති දන්නා සැදැහැවත් කුමාරවරුන්ගේත් ඇපකැප වී පින්කම් කළ මූලික වූ දහසක් පුරුෂයන්ගේත් පුණ්‍ය චේතනාවනට එයින් හානියක් නොවීය.

කුමරුන් තිදෙනා ඒ කඩාකප්පල්කාරී, පාපකාරී පිරිසගේ ක්‍රියා පිළිබඳව කලනොකිරී තමනට සහය වූ ප්‍රමුඛ පෙළේ පුරුෂයන් දස දහසක් දෙනා සමගත්, කටයුතු මැනවින්

ඉටුකළ ජනපද අධිපතියන් සමඟත් පින්කම නිමකොට බුදුරජාණන් වහන්සේ සහ මහ සඟරුවන කාසිපුර පිය මහරජුගේ විහාරයට සුවිශාල පෙරහැරින් වැඩම කරවූහ. පියරජතුමාද දරුවන් විසින් නිසිපරිදි කරගත් මෙම මහා පින්කම පිළිබඳව මුව නොසෑහෙන පරිදි ප්‍රශංසා කරන ලදහ. මෙකී මහා පුණ්‍ය කර්මයේ ආනිසංස බලය හේතු කොට ගෙන මෙහි සඳහන් කළ සැදැහැවත් ගුණවත් රජ කුමරුවන් තුන් පොළ ද, ජනපද අධිපතිවරු ද, කටයුතු සංවිධානය කළ භාණ්ඩාගාරික පුරුෂ තෙමේ ද, අභාවයෙන් පසු තුසිත දෙව්ලොව උපත ලදහ. මේ මහා පිංකමට සම්බන්ධ වූ ලක්ෂ සංඛ්‍යාත ජනයා ද දිව්‍ය, මනුෂ්‍ය දෙගතියෙහි උපදිමින් පසු කාලවල පහළ වූ බුද්ධෝත්පාදයන්හිදී අමාමහ නිවන් සම්පත් ලදහ.

## තුන් බෑ ජටිලයෝ

එදා කාසිරට ජයසේන මහරජාණන් ඵුස්ස බුදු රජාණන් වහන්සේගෙන් ම බණ අසා, සෝවාන් ආදී මාර්ග ඵලවලට පත්ව, බුදුරදුන් වදාළ අනිත්‍ය ප්‍රතිසංයුක්ත දේශනාවක් අසා ගිහියෙක් වශයෙන් ම මහ රහත් බවට පත්ව පිරිනිවන් පා වදාළහ. ඒ ඵුස්ස බුදුරජාණන් වහන්සේගේ මෑණියන් වූ සිරිමා දේවිය ද ඵුස්ස බෝසත් කුමරුවන් බිහිකොට නොබෝ දිනකින් ම අභාවයට පත්ව තුසිත දෙව්ලොව උපත ලබා පිළිවෙලින් දෙව්ලොවින් දෙව්ලොවට ද, බඹලොවින් බඹලොවට පැමිණෙමින් බ්‍රහ්ම සම්පත් ද විඳ නිමකොට බඹලොවදී ම රහත්ව පිරිනිවන් පෑමත් ධර්ම නියාමයකි. ඒ ඵුස්ස බුදුරදුන්ගේ මව්පිය දෙපලගේ සසර ගමන කෙළවර කිරීමේ අනුපිළිවල ය. සහෝදර කුමරුවෝ තුන්පොළ දෙව්ලොවින් දෙව්ලොවට පැමිණෙමින් මහත් වූ සැපත් විඳ අප බුදුරදුන් දවස උරුවේල කාශ්‍යප, නදී කාශ්‍යප, ගයා කාශ්‍යප නමින් බලගතු ඍද්ධිමත් තවුසන් වශයෙන් සිට අපගේ බුදුරදුන් වෙතින් ම, ඒහි භික්ෂු භාවයෙන් පැවිද්ද ලබා මහ රහත් බවට පත්වූහ. ඒ තුන් බෑ ජටිලයන්ගේ දහසක් තවුස්

පිරිස බවට පත්ව අප බුදුරදුන් වෙතින් ඒහි භික්ෂු භාවයෙන් මහන උපසම්පදාව ලබා රහත්බවට පත්වූවෝ එදා රාජ කුමරුවන් තිදෙනා සමඟ පිං කමට මැදහත්ව ක්‍රියා කළ පිරිසට අයත් වූවෝ ම වෙති.

ජනපදයෙහි නියුක්ත ප්‍රමුඛ ජනපදාධිපතියා අප බුදුරදුන් දවස බිම්බිසාර මහරජාණෝ ය. භාණ්ඩාගාරික ගෘහපති පුත්‍රයා අප බුදුන් දවස විශාඛ සිටුවරයාණෝ ය. ඒ භාණ්ඩාගාරික වරයාගේ ඇඹණිය - (බිරිඳ) වූවා අප බුදුන් දවස ධම්ම දින්නා නම් රහත් මෙහෙණියයි. බුද්ධප්‍රමුඛ මහා සංඝ රත්නයට පිළියෙළ කළ දානය උන්වහන්සේලාට පූජා කිරීමට පෙර උඩින් පල්ලෙන් කෑමට පටන්ගෙන පසුව නිබයවම නොයිඳුල් දානය කා ඔවුනොවුන් කලහ කරගෙන එදා දාන ශාලාවට ද ගිණි තැබූ සියල්ලෝම මරණින් පසු අවීචි මහා නරකාදියට වැටුණාහු ය. ඔවුහු නොඉඳුල් දානය කෑවා පමණක් නොව ඊෂ්‍යාවෙන් සහ ක්‍රෝධයෙන් ගහබැණ ගෙන ද්වේශ සිතින් දන් හලට ද ගිණි තැබීම ඒ අපාගතවීමට හේතුවයි. ගුණ නුවණින් යුත් කුමරුවන් ඇතුළු පිරිවර දෙව් සැපත් වළඳා නිවනට පත් වු ආකාරය ද මේ කථා ප්‍රවෘත්තියෙන් අප කාටත් පැහැදිලිව දැකගත හැකිය. පිණක් කරන විට පිණක් වශයෙන් ම මිස කුසලයක් කරන විට කුසලයක් වශයෙන් ම මිස ඒ අස්සේ පාපක්‍රියා කිරීමට යාමෙන් ලැබෙන නරක විපාක මේ තිරෝකුඩ්ඩ සූත්‍ර දේශණාවේ නිදාන කථාවෙහි මෙයාකාරයෙන් දක්වා ඇත.

මෙහි සඳහන් කළ ඵුස්ස බුදුරජාණන් වහන්සේගෙන් පසු, අර පාපකාරීහු අනූ දෙකල්පයක් පුරා ම අවීචි මහා නරකාදියේ ම පැසුණෝ ය. අපායේ ම පැසි පැසී සිටි ඒ නිරිසත්වයෝ මේ මහා භද්‍රකල්පයෙහි තුන්වෙනි වරට බුදු බවට පත් වූ කාශ්‍යප බුදුරජාණන් වහන්සේගේ කාලයේදීම අපා දුකින් මිදී පරදත්තූපජීවී ප්‍රේත ලෝකයේ උපත ලදහ. ඒ බුද්ධ කාලයෙහි පිංවත් මනුෂ්‍යයෝ, ඒ කසුප් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු භික්ෂුණී උභය මහා සංඝයාට මහ දන් වැට පවත්වා ඔවුන්ගේ මියගිය ඥාතීන්ට පිං අනුමෝදන් කරති. ඒ දෙන පිනක් ලබා සැපයට පත්වීමේ

ශක්තිය ලබති. පරදත්තූපජීවී ප්‍රේතයෝ දේවත්වයට පත්වනු දැක දන්වැට කා අපාගත වී සිට ඉන් මිදී මෙම ප්‍රේත භවයට පත් වූවෝ ද මෙසේ සිතූහ. ''අහෝ'' අපටද දෙන පිණක් ලැබුණොත් අනිකුත් ප්‍රේතයින්ටසේම මේ ප්‍රේත දුකින් මිදී දෙවියන් බවට පත්විය හැකිය. කාගෙන් අපි පිණක් බලාපොරොත්තු වෙමුදැයි ඒ ප්‍රේත සමූහයා ඔවුනොවුන් සාකච්ඡා කොට කසුප් බුදුරජාණන් වහන්සේ වෙතට ගොස් ඇත සිට වැඳ වැටී තම දුක කියා පා ''ස්වාමීනි කාශ්‍යප බුදුරජාණන් වහන්ස, පරදත්තූපජීවි ප්‍රේත භවයට වැටී ඇති බොහෝ ප්‍රේතයෝ ඔබ වහන්සේ ප්‍රමුඛ මහා සංඝ රත්නයට දානාදිය පූජා කොට ඔවුන්ගේ ඥාතීන් විසින් දෙනු ලබන පිං අනුමෝදන්ව දේවත්වයට පත් වෙති. දෙවියන් බවට පත්වෙති. දෙවඟනන් බවට පත් වෙති.''

අනේ ස්වාමීනි, අපටද මේ ප්‍රේත දුකින් මිදීමේ මගක් කියා දෙනු මැනවැයි'' ඉල්ලා සිටියහ.

ඒ ප්‍රේතයින්ගේ මේ දුක්ඛිත ඉල්ලීමට ඇහුම්කන් දුන් කාශ්‍යප බුදුරජාණන් වහන්සේ දිවසින් බලා කරුණු දැක වදාරණ සේක්, ''ප්‍රේතයිනි තෙපි සාමුහිකව ඵුස්ස බුදුරදුන් දවස සිදු කරගෙන ඇත්තේ බරපතල අකුසලයකි. ඒ නිසා තොපට මාගේ බුද්ධ ශාසනයෙහිදී ද පිණක් ලබා සැපතට පත් වීමට ඉඩ කඩක් නැත. මේ මහා භද්‍රකල්පයෙහි ම මේ බුද්ධාන්තරය ගෙවී ගිය තැන හතර වෙනි වරටත් සිද්ධාර්ථ ගෞතම නමින් සම්මා සම්බුදුවරයාණ කෙනෙක් පහළ වන්නාහු ය. එදවස බිම්බිසාර නම් මහරජ කෙනෙක් ඒ බුදුරජාණන් වහන්සේගේ අග්‍ර දායක බවට පත් වන්නේ ය. එතුමා ඵුස්ස බුදු රදුන් දවස තොපගේම ඥාති වරයෙකි. ඒ දැහැමි බිම්බිසාර මහරජතුමා ගෞතම බුදුරදුන් ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට, දන් දී තොපට, පිං අනුමෝදන් කරනු ඇත. ඒ පිං බෙලෙන් තොප සියල්ලෝම දිව්‍ය සම්පත් ලබන්නෝ යැයි වදාළ සේක. මේ බුද්ධ වචනයෙන් මහත් සේ ප්‍රමුදිත බවට පත් ඒ ප්‍රේතයෝ ''හෙට දවස ලැබෙන සැපතක් සේ සලකමින් මේ බුද්ධාන්තරයම ගත කළහ. ඒ කසුප් බුදුරදුන් වදාළ පරිදිම බුද්ධාන්තරය ගෙවී ගියේය. ගෞතම

නමින් සම්මා සම්බුදු කෙනෙක් පහළ වූ සේක. රජගහ නුවර රාජධානියෙහි බිම්බිසාර නමින් මහරජ කෙනෙක්ද රාජ්‍යයට පත්විය. එහෙත් තමනට පිං දෙන බවක් නොපෙණුනි. රජ මාළිගාවේ ගෞතම බුදුරදුන් ප්‍රමුඛ දහස් ගණන් සංඝයා වහන්සේට දන් දෙන නමුදු තමනට පිං දෙන බවක් නොදුටහ. මෙයින් දුක්මුසු බවට පත් ඒ ප්‍රේතයෝ රජතුමාගෙන් පිං ඉල්ලා සිටිනු පිණිස, රාත්‍රී භාගයෙහි රජු මඳ නින්දට වැටුණු විට මාලිගාව වටා රැස්ව මහා දුක් අඳෝනාවකින් බියකරු ලෙස සාමූහිකව හඬන්නට වූහ. මේ බියකරු ශබ්දය අසා ඇටකටු පෑදුණු, ඇඟ මස්වලින් තොර නහර ඉල්පුණු, ඉදිරියට නෙරාගිය විලුස්සුනු දත් ඇති, සිහින් ඉත්තෑකූරු සේ විහිදුනු කෙස් වැටි වලින් යුත් අපවිත්‍ර, දුගඳ හමන අතිශයින්ම අශෝභන බඩ පිට කටුවට ඇලුණු, නිරුවත්, ප්‍රේත, ප්‍රේතියන් දැක මහත්සේ භයටත්, සංත්‍රාසයටත්, සංවේගයටත් පත් රජතෙමේ නොනිදා එළිවෙන තෙක් ගත කළහ. උදෑසන වේලුවනාරාමයට ගොස් බුදුරජාණන් වහන්සේ දැක මෙසේ පැවසූහ.

## නපුරු සිහිනයක්

''ස්වාමීනි, බුදුරජාණන් වහන්ස, ඊයේ තුන්යම් රාත්‍රියම මට නින්දක් නැත. කවර කලකවත් අසා නැති - කිසිදාක දැක නැති මහා දුක්ඛිත ප්‍රේත සමූහයක් මාගේ රාජ මාලිගාව වට කොට ගෙන මහා දුක් අඳෝනාවකින් ඇඬූහ. ඒ බිහිසුනු දුක් හඬ මේ මොහොතේ ද මාගේ දෙකනට ඇසෙන්නාසේයැ. චිත්තජ රූප වශයෙන් ඔවුන්ගේ දුක්ඛිතස්වභාවය මගේ සිතට පෙනෙන්නාසේයැ. දහසක් ය, දස දහසක් ය, විසි දහසක් ය කියා ගණනක් නොකිය හැකි තරම් අති විශාල ප්‍රේත සමූහයකි. බුදුරජාණන් වහන්ස, මාගේ රටට භූමි කම්පාවකින්, සුළි සුළඟකින්, මුහුදු ගොඩ ගැලීමකින් සිදුවීමට නියමිත මහා විපතක පෙර නිමිත්තක් සේ මේ පුදුම සිහිනය දුටුවෙම් ද? එසේ නැත්නම් මාගේ රටවැසි ජනතාවට ගං වතුර බියකින්, ඉඩෝරයකින්, වසංගත

රෝගයකින් හෝ යුධ කෝලාහලයකින් සිදු වීමට නියමිත මහ විපතක පෙර නිමිත්තක් සේ මේ සිහිනය දුටුවෙම්ද? '' ''මහරජතුමනි, මෙම සිහිනයෙන් ඔය කියන කිසිවක් අර්ථවත් නොකෙරෙති. රජෙක් වශයෙන් ඔබ සෑම විටම රට ගැන, තම රට වැසියන් ගැන විමසිල්ලෙන් ම සිටීම වටිනා දෙයකි. එය උසස් රාජ ධර්මයකි. රජෙකුගේ වගකීම ද එයයි. ඔබ තම ජීවිතය ගැන බැලුවේ තුන් වැනි වරටයි. එයත් කළ යුත්තකි. තම ජීවතය නිසි පරිදි රැක ගත හොත් රටට දිගු කලක් සේවය කළ හැකිය. එය ඔබ තේරුම් ගැනීම උසස් ගුණයකි. පළමුව රට, දෙවනුව රට වැසියා, තුන් වැනිව තමන් ගැන සිතූ බවක් පෙනේ.

ඉහත සඳහන් රාජ චින්තනය අතිශය වැදගත් ය.මහරජ මෙම දුක්මුසු සිහිනයෙන් ඔබේ රටට - රට වැසියාට හෝ ඔබට කිසිදු විපතක් පෙන්නුම් නොකරයි. මීට අනූ දෙකල්පයකට පෙර ඔබේ ඥාති සමූහයා සාමූහිකව මහා පාප කර්මයක් සිදු කර ගෙන ඇත. එහි විපාක වශයෙන් ඔව්හු සියල්ලෝම අපා දුකට වැටී ඉන් මිදී දැන් පරදත්තූපජීවී ප්‍රේත පිරිස දස දහසක් - විසි දහසක් පමණ නොවේ. ඔව්හු සියල්ලෝම හැට හතර දහසකි. එදා, විපස්සී බුදු රදුන් දවස, ඒ සියල්ලෝම ඕබේ ඥාතීත්වය ද දක්වා - ඔබ විසින් පින් දහම් කොට, මාගේ සාසනයේදී ඔවුන් දුකින් මුදවන බවටද - ඒ කාශ්‍යප බුදු රජාණන් වහන්සේගෙන් දැනගත් පරිදි - මේ දක්වා එය ඉටු නොවුන නිසා තම සත්‍යමය ස්වරූපය දක්වා මේ කරන ලද්දේ ඔබෙන් පින් ඉල්ලා සිටීමකි.

''එසේ නම් බුදුරජාණන් වහන්ස, දැන් මගේ සිතට මහා සහනයකි. මගේ මාතෘ භූමියට - මගේ රට වැසියාට විපතක් - ව්‍යසනයක් සිදු නොවී වෙන කවර දෙයක් සිදු වුවද මට බියක් නැත. දැන් මා කළ යුත්තේ කුමක්දැයි වදාරනු මැනවි.'' ''මහ රජතුමනි, කරුණා පෙරදැරිව බුද්ධ ප්‍රමුඛ මහා සංඝයා වහන්සේට මහා දානයක් පූජා කොට - මට සිහිනෙන් පෙනී සිට මගෙන් පින් බලාපොරොත්තු වුන මාගේ ඥාති සමූහයාට මේ කුසල් බෙලෙන් දිව්‍යමය සම්පත් ලැබේවා' යි පින් අනුමෝදන් කිරීම මැනවි.'' මේ අනුව බිම්බිසාර මහ රජතුමා පසුදා දහවල් රජ ගෙදර මහා දානයක් පිළියෙළ කළේය.

බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ රහතුන් ඇතුළු දහසක් දෙනා වහන්සේ රජ ගෙදරට වැඩම කරවූහ. දන් තථාගතයන් වහන්සේ ද අගසව්වන් වහන්සේලා ඇතුළු රහතුන් ද - මාර්ග ඵල ලාභී භික්ෂූන් සහ සිල්වත් භික්ෂූන් වහන්සේලා ද මාළිගාව තුළ අසුන් පනවා වඩා හිඳ වූහ. මේ අවස්ථාව වන විට අර පින් බලාපොරොත්තු වූ ප්‍රේත සමූහයා මාළිගාව වටේ රැස්ව සිටියහ. බුදුරජාණන් වහන්සේ ඇතුළු මහා සංඝයා වහන්සේ දන් වළඳා නිමවූ විට සිදු කරගත් මේ මහා පින් අනුමෝදන් කිරීමට රජතුමා සහ පිරිස තැන්පත්ව වාඩිවූහ. එකෙණෙහි අර සියලුම ප්‍රේතයන් රජතුමාටත්, අර පිරිසටත් පෙනෙන පරිදි බුදුපියාණන් වහන්සේ අධිෂ්ඨානයක් කළ සේක. ඒ දැක රජ ඇතුළු මහා පිරිස මහත්සේ සංවේගයට පත්ව ''මා විසින් සිදු කරගත් මේ දානමය පුණ්‍ය බලයෙන් සිහිනෙන් දුටු මාගේ ඥාති ප්‍රේතයෝ දිව්‍ය ගතියට පත් වෙත්වා'යි - සැපතට පත් වෙත්වා'' යි පැන් වඩා පින් අනුමෝදන් කළහ.

ඒ පින් ලබා සියලු ප්‍රේත සමූහයා දිව්‍යමය සැපයට පත්ව එදිනම රාත්‍රියෙහි දෙවියන්, දෙවඟනන්සේ බබළමින් පෙනී සිටියද ඔවුහු සියල්ලෝම දිව්‍යමය සළුවලින් තොරව සිටිනුදැක රජතුමා පසු දින චීවර සහිතව බුදුරදුන් ප්‍රමුඛ දහසක් මහා සඟනට මහා දානයක් පූජා කොට ඒ වස්ත්‍ර දානයේ ආනිසංශ ද අනුමෝදන් කළහ. එදින දුන් පින් අනුමෝදන්ව හැට හතර දහසක් පමණ වූ දේව සමූහයා පෙරදා සේම දිව්‍යමය වස්ත්‍රාභරණ සහිතව රජු ඉදිරියෙහි පෙනී සිටියහ. රජතුමා මහත් සේ සතුටු දානයෙන් පසු බුදුරජාණන් වහන්සේ තිරොකුඩ්ඩ සූත්‍රය මාතෘකා කොට රජු ඇතුළු මහා පිරිසට භුක්තානුමෝදනා ධර්ම දේශනාව වදාළ සේක. ඒ මෙසේ ය.

''මහ රජතුමනි, මිය ගිය ඥාති ප්‍රේතයෝ ජීවත් වන ඥාතීන්ගෙන් පින් බලාපොරොත්තුව, ඒ ඒ අයගේ නිවෙස්වල දෙන පිනක් අනුමෝදන් වීමට බලාපොරොත්තුවෙන් පසුවෙති. ඥාතීන්ගේ ගෙවල් දොරවල් වලට යන එන මංසන්ධි වලද රැඳී සිටිති. ඔව්හු සිල්වත් ගුණවත් උතුමන් කෙරෙහි ආහාරපානාදිය වස්ත්‍ර, සෙනසුන් සහ ඖෂධීය බෙහෙත් - හේත් පුදා මියගිය ඥාතීන් සිහිපත් කර පිං

අනුමෝදන් කරන්නාහුය. මියගිය ඥාතීන් වෙනුවෙන් තමන් ලද ධාර්මික දේ පැහැදුණු සිතින් යුතුව පූජා කොට ඒ පිං අනුමෝදන් කිරීම මියගිය ඥාතීන්ට කරනු ලබන ඉහළම සංග්‍රහයයි. ඒ සැදැහැවත් ගුණවත් මිනිස්සු මියගිය ඥාතීන් කෙරෙහි ඇති අනුකම්පාව හා දයාව නිසා පිරිසිදු වූ ප්‍රනීත වූ ආහාරපාන මහා සංඝයාට කැප සරුප් පරිදි සුදුසු අවස්ථාවන්හි පූජා කොට ''ඉදංමේ ඥාති නං හෝතු - සුඛිතා හොන්තු ඥාතයෝ'' යනුවෙන් මා විසින් සිදුකරගත් මේ පින මාගේ ඥාති ප්‍රේතයන්ට ලැබීමෙන් ඔව්හු සුවපත් වෙත්වා. යි පිං අනුමෝදන් කරන විට ඒ ඥාති ප්‍රේතයෝ ද එතනට රැස් වන්නාහ. පුණ්‍ය බලය අනුමෝදන්ව සැපතට පත් වන්නාහ.

ඒ ප්‍රේත භවයෙහි උපත ලද අයට ගොවිතැන් කිරීමක් නැත්තේය. එසේම ගව රැක්ම ද නැත්තේය. වෙළහෙළදාම් ද නැත. රන්, රිදී, මුතු, මැණික් ගණු දෙනු ද නැත. ඒ ප්‍රේතයෝ මේ ලෝකයේ සිට අනුමෝදන් කරන පිනක් ලබා සැපතට පත්වීම ස්වභාවය'යි. වෙනත් පිළිසරණක් ඔවුනට නැත. පරදත්තූපජීවී ප්‍රේත භවයට වැටුණු කාට වුවද එකම පිහිට - දෙන පිනක් ලැබීම හැර වෙනත් පිහිටක් නැති බව ය. උස් තැනක ගලා හැලෙන වර්ෂා ජලය පහත් බිම් තෙමා ගෙන ඉතිරී පැතිරී යන්නේ ද එපරිද්දෙන් - මිනිස් ලෝකය නැමති උස් තැන සිට අනුමෝදන් කරවනු ලබන පින පහත් භූමියක් වූ ප්‍රේත භවයෙහි සිටින අයට සැපතක් ම ලබා දෙන්නේ ය. මෙසේ මහා ගංගාදියෙන් ගලා යන ජලයෙන් මහා සාගරයම පිරෙන්නා සේ අප විසින් දෙන ලද පින ඒ පරදත්තූපජීවී ප්‍රේතයන්ට ලැබෙති. ඒ පින් අනුමොදන් කරන විට ද, ''මියගිය ඥාතීහු අපට මෙසේ සැලකුවාහුය, අපි ගැන සොයා බැලුවාහුය, අපගේ අඩුපාඩු සපුරා දුන්නෝය, අප වරදින් වළක්වා ගැනීමට අවවාද අනුශාසනා කළහ. ඒ නිසාම අපගේ දියුණුවක් ඇති විය. මෙසේ සිතා කරුණා පෙරදැරිව පින් අනුමෝදන් කළ යුතුය. මරණයට පත් වූ අය ගැන හැඬීම, වැළපීම, දුක්වීම ආදිය නිසා මිය ගිය අයට හෝ ජීවත් වන අයට වැඩක් නොවෙති. දෙන පින් අනුමෝදන් වීමෙන්ම ඒ ඥාති ප්‍රේතයෝ ඒකාන්තයෙන්ම සැපතට පත් වන්නාහුය.

## නෑකමේ දැඩිබව

මියගිය ඤාතීන්ට පින් දීමේ දී වැදගත් කරුණු හතරක් මතුවන බව පෙනේ. මොවුහු මියගිය ඥාතීන්ගේ ගුණ සලකත් යැයි උදාර ඤාති ධර්මයක් පෙන්නුම් කෙරේ. දෙවැන්න මිය ගිය ඥාතීන්ට සැපතක් ලබා දීමය. තුන්වැන්න නම් ආර්යය මහා සංඝයාට ද ජීවත් වීම පිණිස ශක්තිය ලබා දීමය. මේ කෙළෙහි ගුණ සැලකීමේ මහා පින්කම නිසා දායකවරු ද අපමණ පිනක් රැස් කර ගනිති.

**''සො ඤාති ධම්මොච අයං නිදස්සිතො**
**පෙතාන පූජා ච කතා උළාරා**
**බලඤ්ච භික්ඛුන මනුප්පදින්නං**
**තුම්හේහි පුඤ්ඤං පසුතං අනප්පකං''**

යන තිරෝකුඩ්ඩ සූත්‍රයේ එන අවසාන ගාථාවේ දක්වා ඇත්තේ ඉහත සඳහන් කළ අදහසයි. සම්පූර්ණ තිරෝකුඩ්ඩ සූත්‍රය මෙහි අවසානයට යොදා ඇති බව සැලකිය යුතුය. මෙය නොනවත්වා කියා ගෙන යෑමේ පහසුව පිණිස එසේ අගට යෙදූ බව දක්වා ලීමට කැමැත්තෙමු. අතරින් පතර ගාථා ලිය - ලියා අදහස් පළකිරීමේදී කිය වන පාඨකයන්ට අපහසුවක් ඇති වන බැවිනි. ඒ ගාථාවන්ගේ අදහස ඉහත සඳහන් කරන ලදී. මෙහි සඳහන් කළ ගාථාවෙහි ඇතුළත් ප්‍රධාන කරුණු හතරක් ගැන කරුණු ටිකක් පැහැදිලි කළ යුතුව තිබේ. ''සො ඤාති ධම්මොච අයං නිදස්සිතො'' යනුවෙන් ඉතා වැදගත් අදහසක් ඉදිරිපත් කෙරෙයි. එනම් මිනිස් වර්ගයා අතර පමණක් නොව තිරිසන් සතුන් අතරද පවත්නා වූ ඤාතීත්වය විශිෂ්ටතම ගුණ ධර්මයක් බවයි. මව් - දෙමව්පියන්, සහෝදර - සහෝදරියන් ඇතුළු ඒ හා බැඳී පවත්නා වූ දිගින් - දිගට වැළක්සේ විහිදී ඇති පිරිස මෙහි ඤාති නමින් දක්වා ඇත. ''ඤාතකානඤ්ච සංගහෝ'' යන්නෙන් මහා මංගල සූත්‍රයේ දී ද බුදුරජාණන් වහන්සේ තම ඤාතීන් ගැන සොයා කියා බැලීම - නැති බැරි ඤාතීන්ට

උපකාර වීම මංගල කරුණක් සේ දක්වා ඇත.

කෝසල මහා රාජයාගේ පුතණුවන් වූ විඩූඩභ රජතුමා චතුරංගනී සේනාව පිරිවරාගෙන ශාක්‍ය දේශයට යුද්ධයට යද්දී කල් ඇතුව බුදුරදුන් යුද බිමට ගොස් වැඩ සිටියහ. විඩූඩභ රජතුමා පැමිණ ''තථාගතයන් වහන්ස, මේ තද හිරු රශ්මිය ඇති යුද භූමියෙහි වැඩ නොසිටිනු මැනවි. අර මගේ රට පැත්තේ වැඩුනු ගස් කොළන් ඇති සිසිල් සුළඟ ඇති තැනකට වඩිනු මැනව'' යි වැඳ නමස්කාර කොට ආරාධනා කළහ. එවිට බුදුරජාණන් වහන්සේ වදාරණ සේක්, ''විඩූඩභ රජතුමනි, අර ශාක්‍ය දේශයේ පිහිටි පැත්තේ සිට හමා එන සුළඟත් මට වඩාත් සනීප දායකයැයි'' පැවසීමෙන් අදහස් කළේ ඥාතී සංග්‍රහයයි. බුදුරදුන්ගේ අදහස තේරුම් ගත් කෝසල පුත්‍ර විඩූඩභ රජු සටනට ගිය ගමන නවතා ආපසු පැමිණියේ ය. මෙසේ දෙවරක්ම ශාක්‍ය වංශික ඥාතීන් ගලවා ගැනීමට බුදුරදුන් ඉදිරිපත් වූ ආකාරය බුදු සිරිතෙන් මනාව පැහැදිලිය. බුදුරදුන් පළමු ගමන සුද්දෝධන මාළිගාවට වැඩි අවස්ථාවේ දී කුඩා රාහුල කුමරුවා ''සුඛාතේ සමණ ජායා'' යනුවෙන් ''ස්වාමිනි, ඔබ වහන්සේගේ සෙවණත් මට සැපදායක යැයි'' පවසමින් බුදු රදුන්ගේ දකුණත ඇඟිල්ලක් අල්ලාගෙන රාහුල කුමරුවා බුදුරදුන් සමඟම වෙහෙරට ගියේ මේ ලේ නෑකම නිසාම ය.

ජීවිත්වන ඥාතීන් විසින් මිය පරලොව ගිය තම ඥාතීමිත්‍රාදීන් වෙනුවෙන් විය පැහැදන් කොට - වෙහෙස මහන්සි වී විවිධ පින් කම් කෙරෙති. දන් දෙති, පන්සල් වෙහෙර විහාරස්ථාන ඉදිකරති, පාසල් - වැඩිහිටි නිවාස - ආරෝග්‍ය ශාලා - බෝධිඝර - පැන් පොකුණු - පාලම් - ඒ දඬු තනවා පොදු ජන යහපත පිණිස පූජා කෙරෙති, පරිත්‍යාගයන් කෙරෙති. විවිධ අග හිඟකම් නිසා අධ්‍යාපනය ලබා ගැනීමට අපහසු දරුවනට නොයෙක් අයුරින් උපකාර කෙරෙති. නැති - බැරි අයට, දුගී - මගී යාචකාදීන්ට සලකති. දුකට පත් තිරිසන් සතුන්ටද ආහාර පාන සපයා දීමෙන්, අභය දානය ලබා දීමෙන් මහා පින්කම් කෙරෙති. මෙවන් පින් කම් කොට ''අප සිදු කරගත් මේ කුසල බලය හේතු කොටගෙන මිය පරලොව

ගිය අපගේ මව්පියන් ඇතුළු ඥාතීන්ට සැපතක්ම වේවා'' යි පින් අනුමෝදන් කරති. එවන් පින්කම් කරන විට දායකයන් පිළිබඳව කා අතරත් යහපත් ගුණ ඝෝෂාවක් පැතිර යන්නේය. මොවුහු කෙළෙහි ගුණ සලකන - යුතුකම් ඉටු කරන ගුණ සම්පන්න ඇත්තෝය' යන ඒ ගුණ ඝෝෂාව මෙලොව වශයෙන් තම පවුල ප්‍රසිද්ධියට පත්වීමට - පිළිගත් පවුලක් බවට පත්වීමට හේතු වන්නේ ය. ඒ නිසාම ඒ පවුල්වල දියුණුවක් - ප්‍රකට බවක් ඇතිවේ. මේ නිසා රටේ තොටේ උසස් පුද්ගලයන් බවට පත් වීමත් නිතැතින්ම ඇති වන ගතියකි. එය තමා කරගත් ඥාති සංග්‍රහය තුළින් ලබාගත් කුශලයෙහි ''දිට්ඨ ධම්ම වේදනීය'' විපාකයයි. මේ භවයේ දීම ලැබෙන ආනිසංස කොටස එය බව සැලකිය යුතු ය.

ඉහත සඳහන් ගාථාවේ දෙවැනි පදයෙන් කියැවෙන්නේ ''පේතාන පූජාච කතා උළාරා'' මිය පරලොව ගිය ඥාති ප්‍රේතයින්ට මහා සැලකිල්ලක් කළ බව ය. ''චිරං ජීවන්තු නො ඤාති, යෙසං හේතු ලභාමසෙ'' යනුවෙන් වෙහෙස මහන්සි වී තම ධනය කැප කොට මහා පින් කම් කොට පින් අනුමෝදන් කිරීමෙන් පරදත්තූපජීවි ප්‍රේත භවයෙහි වැටී සිටි අප ඒ මහා දුකින් ගලවා අද මේ ලබා ඇති දිව්‍ය සැපයට පත් කළෝ, මේ මේ ඥාතිහුය, මේ මේ නම් ගම් ඇති උදවියයි. අනේ ඔවුනට සැපතක්ම වේවා යි පිරුණු කරුණා හදවතින් යුතුව ආශිර්වාද කරන්නෝ ය.

එය ජීවත් වන පින් දුන් ඥාතීන්ට මහා සැනසිල්ලකි. ඇස්වහ කටවහ - දෝසා දිය භංග වීමට, අපල උපද්‍රව නැති වීමට, හතුරු උපද්‍රවයන්ගෙන් ආරක්ෂා වීමට මහත් වූ බලවේගයක් වන්නේ ය. මිය ගිය ඥාතීන්ගේ මේ ආශිර්වාදය නිසා තම දේපළ වලටද විපතක්වීමට ඉඩ නොදෙන අතර, තමන්ගේ - තම දරුවන්ගේ යහපත පිණිසද බලයක් වන්නේ ය. ඇතැම් දරුවන් මන්දෝත්සාහීව නොමගට බර වෙමින් කටයුතු කෙරෙති. මේ පිළිබඳව මව්පියෝ මහත් සේ දුකට පත් වෙති. මේ අතර තමන් බලාපොරොත්තු නොවූ ආකාරයෙන්, අර දරුවා ක්‍රියාශීලී යහපත් ගති පැවතුම් ඇති කෙනෙකුන් බවට පත්ව දක්ෂ ලෙස අධ්‍යාපනය නිම කොට උසස්

පුද්ගලයෙක් බවටද පත්වෙති. ''අනේ. මේ දරුවා පසුගිය කාලයේ හැසුරුණු - ජීවත් වුණු ආකාරය අනුව අද මේ සිටින තත්වයට කවදාවත් පත්වේ යැයි අපි නම් සිහිනයකින් වත් හිතුවේ නෑ. එහෙත් අද ඉතාමත්ම හොඳ පුද්ගලයෙක් බවට පත් ව අපේ පවුල ද ආලෝකවත් කර තිබෙනවා.'' මෙසේ ඇතැම් මව්පියන් කරන ප්‍රකාශ අපට අසන්නට ලැබෙන අවස්ථා බොහෝ ය. තමන් දුන් ඒ පින් අනුමෝදන්ව සැපයට පත්වූ දේවත්වයට පත් වූ - ඥාති දෙවියෝ - දෙවඟනෝ ඒ දරුවාගේ මනස යහමගට යොමු කිරීමට උපකාරවත් වන්නට පිළිවන. එය අපට දැකගන්නට නොහැකි වුවද, ඔවුන් එසේ උපකාර කෙරෙති. නොසිතූ පරිදි භයානක උපද්‍රවයන්ගෙන් බොහෝ විට අප ආරක්ෂාවන්නේද මෙවන් මියගිය ඥාතීන්ගෙන් ලැබෙන පිහිට නිසා නොවේ යැයි කාට කිවහැකිද?

## සැරියුත් තෙරණුවෝ

තථාගත බුදුරජාණන් වහන්සේගේ අග්‍රශ්‍රාවක සාරිපුත්ත මහ රහතන් වහන්සේ දිනක් සවස් භාගයේ වන රොදක් මැදින් රජගහනුවර වේළුවනාරාමයට වඩිති. පුළුල් ගුරු පාරකි. ඉර බැහීගෙන යන හැන්දෑ යාමයයි. පෙරදින අහස බැසී යන හිරු එළිය වැටී රක්ත වර්ණයෙන් බබළයි. පක්ෂි ගනයා කැදලි කරා නාද දෙමින් පියාඹති. ඒ අවට කිසිවෙක් නොවී ය. සැරියුත් තෙරණුවෝ හුදකලාව වඩිති. කැළෑව අයිනේ කුඩා පඳුරු අතර සිට සිහින් කටහඬකින් උන්වහන්සේට කතා කරණ බවක් ඇසුණි. ''පුතණුවණි සාරිපුත්ත, මම ඔබේ මවයි. මා මේ දුකින් ගලවාගන්න. පුතණුවෙනි උපතිස්ස, ඔබ මගේ දරුවෙක්, මම දැන් දුකට වැටී සිටිමි. මා මේ දුකින් ගලවා ගත හැක්කේ ඔබට පමණයි.'' යනුවෙන් දෙතුන් වතාවක්ම කියා. උන්වහන්සේ නැවතී මේ කියමනට ඇහුන් කන් දුන් සේක. කියන දේ ඇසෙතත් කියන්නේ කවුරුන්දැයි නොපෙනෙති. හඬ ඇසෙන තැනට ගිය විට නැවත තව තැනක සිට අර වචනම කියන හඬ ඇසේ.

එතනට ගිය විට තවත් බඹ කිපයකට ඈතින් සිට කියන හඬ ඇසේ.

පියවි ඇසට නොපෙනෙන බැවින් සාරිපුත්ත තෙරණුවෝ වහා සමාපත්තියට හිත යොමුකොට මේ කතා කරන්නේ කවුරුන්දැයි දිවසින් බැලූසේක.'' පුදුමයකි, ඉතා විරූපී ප්‍රේතියකි. ඇටකටු පෑදුන, නහර ගැට ගැසුන, ඉත්තෑකුරු සේ කෙලින් සිටි කෙස් ගස් ඇති, විසිරුණු දත් වලින් යුත්, අපවිත්‍ර, විරූපී ශරීරයකින් හෙබි ප්‍රේතියෙකි. තමන්ගේ මවයයි පවසන හෙයින් පෙර භවය දැකීමේ නුවණින් ඇය කවුරුත් දැයි බලත්ම, මීට පෙර පස්වෙනි භවයෙහි තමන්ගේ මෑණියන් බව දුටුසේක. නැවත මේ ප්‍රේතිය කියන්නී ''පුතණුවනි, සාරිපුත්ත, එදා කළ පාප කර්‍මයන්ගේ විපාක වශයෙන් කාලන්තරයක සිට මම අපාගතව සිටියෙමි. දැන් අපා දුකින් මිදී පරදත්තූපජීවි නමැති (දෙන පිනකින් ගොඩ විය හැකි) ප්‍රේත භවයට වැටී ඇත්තෙමි. මා මේ දුකින් මුදවා ගත හැක්කේ ඔබට පමණයි. අද ඔබ දැකීමෙන් පෙර ඥාති සම්බන්ධය දැන ගත හැකිවිය''. ප්‍රේත මවගේ මේ වචනවලින් සාරිපුත්‍රයාණන් වහන්සේ මහත් වූ ධර්ම සංවේගයට පත්ව ''මෑණියෙනි, මම ඔබ හෙටම මේ දුකින් ගලවා ගන්නෙමි. එතෙක් ඉවසනු මැනවැයි'' ඇය සනසා සාරිපුත්‍රයන් වහන්සේ වේළුවනයට වැඩියහ.

උන්වහන්සේ පසුදා උදෑසනම මුගලන් මහ තෙරුන් - අනුරුද්ධ මහතෙරුන් - අනඳ මහතෙරුන් හා කච්චායන තෙරුන්ද යන සිව් නම වෙසෙන කුටි වලට වැඩමවා ''අද දවල් දානය පිණිස මාගේ කුටියට වැඩම කරවනු මැනවයි'' උන්වහන්සේලා වැඩ සිට ඒ ඒ තැන් වලට දුර බැහැර බැවින් ඍධි බලයෙන් ගොස් ආරාධනා කළහ. ඉන්පසු සැරියුත් තෙරණුවෝ දෙවරක්ම පිඩුසිගා වැඩ ලැබුණු ආහාරය තැන්පත් කොට තිසි පරිදි සකසා තබා තමන් වහන්සේට ලැබී තිබුණු සිවුරු පිරිකර සහ බේත් හේත් වර්ගද ක්‍රමවත්ව තැන්පත් කොට නිමවෙත් ම පෙර කී සිව්දෙනා වහන්සේද දුර බැහැර වනසෙනසුන්වල වැඩසිටි බැවින් නියමිත වේලාවට අහසින් මෙම දානයට වැඩම කළහ. සැරියුත් තෙරණුවෝද උන්වහන්සේලා වඩා හිඳුවා තමන් වහන්සේ කලින් දා දුටු

ප්‍රේතමාතාව පිළිබඳව පැහැදිලි කොට ''කාලකතානං මේ ඤාතීනං පුඤ්ඤත්ථාය - ඉමං භික්ඛං සපරික්ඛාරං භික්ඛු සංඝස්ස දේම'' යනුවෙන් තෙරවරුන් වෙත වැඳගෙන - මිය පරළොව ගොස් මාගෙන් පිං බලාපෙරොත්තු වන ඒ මාගේ මව ඇතුළු ඤාතීන්ට පිං පිණිස මේ දානයත්, පිරිකරත් මහා සංඝරත්නයට පූජා කරමියි'' තුන් වරක් කියා දානය පූජා කොට පිරිකරද පුදා, ''ඉදං මේ ඤාතීනං හෝතු - සුඛිතා හෝන්තු ඤාතයො'' යනුවෙන් පැන්වඩා පිං අනුමෝදන් කළහ. ඒ ප්‍රේතියද මහත් සතුටින් ඒ පිං අනුමෝදන්ව ප්‍රේත ආත්මයෙන් මිදී දෙවඟනක් බවට පත්වූවාය.

එතැන් පටන් මේ දෙවඟන තමන්ට මහත් උපකාරයක් කළ මෙබඳු දිව්‍යමය සැපයකට පත්කළ - සුරියුත් මහතෙරුන් අදෘශ්‍යමානව සිටිමින් ආරක්ෂා කරති. මේ දානමය පිංකමෙන් විසි වසරකට පමණ පසු සැරියුත් මහරහතන් වහන්සේ රෝගාතුර බවට පත්වූහ. ඒ දිනවල උන්වහන්සේ වැඩ සිටිසේක්, රජගහනුවර ගිජ්ඣකූට පර්වතයෙහි ය. කුසේ අමාරුවකි. වේදනාව අධිකය. බඩ වැල් ඇඹරෙන්නාක් මෙන් - පෙරලෙන්නාක් මෙන් අධික වේදනාවකි. මුහුණ තදින් රත් පැහැයට පත්ව ඇත. හිසෙනුත් - ඇඟෙනුත් දහඩිය වැගිරෙයි. මෙය දැනගත් භික්ෂූන් වහන්සේලා විවිධ ප්‍රතිකාර කළහ. ගුණදායක බෙහෙත් වර්ග - කැඳ වර්ග වැළදෙව් නමුදු සුවයක් නැත. ලඟ සිට බොජ්ඣංග සූත්‍ර ආදී පිරිත් දේශනා පවත්වන විට, එවෙලාවට පමණක් වේදනාව අඩුවී නැවත වැඩිවේ. මුගලන් මහ රහතන් වහන්සේද සාරිපුත්‍රයාණන් වහන්සේගේ මෙම අසනීපය දැනගෙන වහා ගිජුකුලු පව්වට වැඩිසේක. උන්වහන්සේද අනෙකුත් සංඝයා වහන්සේලා සමඟ අවශ්‍ය ප්‍රතිකර්මාදිය කෙරෙති. මෙසේ රෝගී බවට පත්ව වේදනාවෙන් පසුවෙන සැරියුත් තෙරුන් ලඟ වාඩි වී ප්‍රතිකර්ම කරන අතර, තුන්වෙනි දවසේ රාත්‍රී භාගයේදී වේදනාවෙන් ඇඹරෙන සැරියුත් තෙරුණ්ගෙන්, ''ස්වාමිනි සාරිපුත්‍රයාණන් වහන්ස, මෙම රෝගය ඔබ වහන්සේට මින් පෙරත් වැළඳී තිබේද?'' ''ආයුෂ්මත් මොග්ගල්ලාන තෙරණුවෙනි, මෙ රෝගය මගේ වයස අවුරුදු දහ නවය

පමණ කාලයේදී වැළඳුණි. නැවත තක්ෂලා නුවර අධ්‍යාපනය ලබා නිමකොට පැමිණි කාලයේදී ද මේ රෝගය හටගත්තේය.

අනේ - ස්වාමිණි, එදා ඔබ වහන්සේට බෙහෙත් කළේ මේ රජගහනුවර සුප්‍රසිද්ධ ජීවක වෙද තුමන්ද? නැත්නම් අතුල වෛද්‍යාචාරීතුමාද? එසේත් නැතිනම් සේනක වෙද තුමන්ද? අපට කියනු මැනවි. වහා හෙට උදෑසනම එදා ප්‍රතිකාර කළ වෙදතුමන් වෙත ගොස් අවශ්‍ය බෙහෙත් නැත්නම් - ඒ වෙදතුමන් කැඳවාගෙන පැමිණීම හෝ කළ හැකිය''. ''මොග්ගල්ලාන තෙරණුවෙනි, වෙදකෙනෙකුගෙන් ප්‍රතිකාර ගත්තේ නැත. ඒ අවස්ථා දෙකේදීම මගේ මව - රූපසාරි බ්‍රාහ්මණ මාතාව සුවිශේෂ, ඖෂධීය කිරි බතක් පිළියෙල කොට දෙන්නීය. ඒ ඖෂධීය කිරිබත් අනුභව කිරීමෙන් පසු ඒ දෙවාරයේදීම රෝගය සංසිඳීගියේය.'' එසේනම් ස්වාමීණි අනුකම්පා කොට ඒ බෙහෙත සකස් කරන ආකාරය සහ යොදා ගන්නා ඖෂධ වර්ග කියනු මැනවි. එය අපට පිළියෙල කළ හැකිය. ඔබ වහන්සේ රෝගාතුරව සිටින බව අසා - අද සවස් කාළයේද බිම්බිසාර රාජමාළිගාවෙන් රෝගී තත්වය විමසා මාළිගාවට වැඩමවාගෙන ගොස් ප්‍රතිකාර කිරීමට රාජ දූතයන් දෙපළක් එවා තිබුණි. එතුමා ලවා හෝ වැදගත් දායක කෙනෙකුට කියා එම ඖෂධීය කිරි බත සකස් කරවිය හැකිය. සැරියුත් තෙරුන් රෝගාතුරව ඇතැයි අසා එක එක්කෙනා එති. ඔව්හු අවශ්‍ය දෙයක් විමසති. හෙටත් ඔය වගේම වැළ නොකැඩි පිරිස එනවාට සැකයක් නැත. හෙට වන විට මේ ආරංචිය වඩ වඩාත් කටින් කට පැතිරී යන හෙයිනි. එයින් සුදුසු කෙනෙකුට දන්වා මේ බෙහෙත සකස් කළ හැකිය. එකී බේත සකස් කරන ආකාරය පවසනු මැනවි''.

## දෙවඟනකගේ උපකාරයක්

මේ වන විට රාත්‍රී ප්‍රථම යාමයෙහි හෝරා හතරක් පමණ ඉක්ම ගොස් ඇත. එනම්, පැය දෙකකි. අද හැටියට නම්, රාත්‍රී 8.00 පසු වුනා විතරය. භික්ෂූන් වහන්සේලාද සිය

නමකටත් වඩා සැරියුත් තෙරුන්ගේ කුටිය වටා රැස්ව සිටිති. මුගලන් තෙරුණ්ගේ ඉල්ලීම පිට සැරියුත් තෙරුණුවෝ මව පිළියෙල කොට දෙන බෙහෙත ගැන කරුණු පැහැදිලි කරමින් - ''ආයුෂ්මත් මොග්ගල්ලාන තෙරුණුවෙනි, මාගේ මව කළු ගල් වලට අයත් විශේෂ තිරුවානා ගල් තුනක් මත අරුණුවත් ඇල් හාල් ගෙන එයට ඇඹරූ අල වර්ග, කොළ වර්ග, පුච්චන ලද රත්තරන් අළු, ගෝරෝචන, කස්තුරි ආදියද - එක් එක් වර්ග වලට අයත් තව තව බෙහෙත් වර්ග සමඟ අඹරා මිශ්‍රකොට පැඟිරි දර වලින් ගිණි දල්වා මගේ මෑණියෝම මේ ඖෂධීය කිරිබත පිසන්නීය'' මෙසේ ගනු ලබන ඒ ඒ බෙහෙත් වර්ගවල නම් සහ ප්‍රමාණයද පැහැදිලි කළේය. ලඟ සිටි භික්ෂූන් වහන්සේලාත් මුගලන් තෙරුණුවෝත් සවිස්ථරාත්මකව පැවසූ ඒ බෙහෙත් වර්ටෝරුව අහ කියා ගත්හ. අවශ්‍ය පරිදි අමතක වේයැයි සිතා පුස්කොළයක වහා ලියා ගත්හ. අනතුරුව එදින රාත්‍රිය එළිවෙන තුරු දීගෙන ආ බෙහෙත් වර්ග ද දෙමින් බොජ්ඣංග සූත්‍ර දේශනාදිය පවත්වමින් ගත කොට පසුදා උදෑසන තරමක් දවල් වෙන්නට හැර මුගලන් තෙරුණුවෝ රජ ගෙදරට යන අදහසින් පිටත් වූහ. මේ බෙහෙත් වර්ගද ඇතුළත් ඖෂධීය කිරිබතක් වන නිසාය.

ගිජ්ඣකූලු පව්වෙන් බසින් විට නොයෙක් දෙනා මුගලන් තෙරුණ්ට හමුවෙති. ''සැරියුත් හාමුදුරාවෝ රෝගාතුර බව දැනගන්නට ලැබුනා. උවමනා කරන බෙහෙතක් - කසායක් කියනු මැනවැයි'', හමුවෙන හමුවෙන අය මුගලන් තෙරුන්ගෙන් අසති. මේ අයට මෙම ඖෂධීය කිරිබත සකස් කිරීමට ශක්තිය නැති බව උන්වහන්සේ දනිති. එනිසා ඔවුනට ''පසුව කියන්නම් යැයි'' ඔවුන් සනසමින් රජගහ නුවරට වැඩියහ. දස දහස් සංඛ්‍යාත සෙනඟ එහා මෙහා යන වීදියක උන්වහන්සේ වෙත පැමිණ, ''ස්වාමිණි, මුගලන් මහ රහතන් වහන්ස, සාරිපුත්ත මහා රහතන් වහන්සේ දැඩි ලෙස රෝගාතුරව සිටින බව අපට දැනගන්නට ලැබුණා. උන්වහන්සේට යෝග්‍ය - සුදුසු ඖෂධීය බෙහෙත් වර්ගය සකස් කොට තිබෙනවා. අනුකම්පා කොට මා සමඟ වඩිනු මැනවි. ඒ බෙහෙත පිළිගැන්වීමට අපි බලවත් ආශාවෙන්

සිටිනවා''. මෙසේ කියා මුගලන් තෙරුණ් කැඳවාගෙන උන්වහන්සේලා දන්න කියන ඉහළ පෙළේ වැදගත් බ්‍රාහ්මණ මන්දිරයකට පමුණුවන ලද්දීය. මුගලන් තෙරුණ් දුටු විගස බ්‍රාහ්මණ මන්දිරයේ පිරිසත්, අවට ගෙවල් වල පිරිසත් වහා වටවී මුගලන් තෙරුණ් පිළිගෙන සැරියුත් තෙරුණ් ගැන මහා බැඳීමකින් තොරතුරු විමසා, පළමුව මුගලන් තෙරුණ්ට දානය පිළිගැන්වූහ. උන්වහන්සේ වළඳා නිමවෙත්ම ඒ පාත්‍රය ගෙන සුවඳ පැන් වලින් සෝදා පිළියෙල කරන ලද සුවිශාල නෙළුම් කොළයක තැන්පත් කරන ලද මේ ඖෂධීය කිරිබත පාත්‍රය තුළ තැන්පත් කොට වැඳ,

''ස්වාමිණි, මුගලන් තෙරුණ් වහන්ස, ඔබ වහන්සේ එනතුරු අප බල බලා සිටියා. සැරියුත් තෙරුන්ගේ රෝගාතුර බව අපට දැනගන්නට ලැබුණි. පිළියෙල කරන ලද මේ ඖෂධීය කිරිබත අපි බෙහෙතක් සාදන ආකාරයෙන්ම අවශ්‍ය ඖෂධීය වර්ග යොදා, සුභ මොහොතකින් අද උදේ ලිප මත තබා කරුණු දන්නා වැඩිහිටි මව් කෙනෙක්ම කිරිබත පිසිනු ලැබූවා. ලිප මත පැසෙත්ම විහිදුණු සුවඳ අනුව මෙය නම් සුවිශේෂමය ඖෂධයක් යැයි අපට වැටහුනා. මේ කිරිබත සැරියුත් මහ රහතන් වහන්සේට වළඳවනු මැනවි. වහා උන්වහන්සේගේ ඔය බරපතල අබාධය සැනකින් සුව වන බව අපට විශ්වාසයි. මේ ඖෂධය පිළිබඳ ලැබුණු උපදෙස් හා ඖෂධීය සුවඳත් එයට හේතුවයි.''

මුගලන් තෙරණුවෝ පළමුවෙන් ඒ දායකවරු පිළිගැන්වූ දානය වළඳා නිම වෙත්ම තම පාත්‍රයට පිළියෙල කර දුන් මේ ඖෂධීය කිරිබත පා ගමනින් ගොස් පිළිගැන්වීමට වේලා මදි බැවිනුත්, බෙහෙත තරමක රස්නයකින් යුතුවම පිළිගැන්විය යුතු නිසාත් සැකෙවින් පින් අනුමෝදන් කොට ඍද්ධි බලයෙන් වහා අහසට පැන නැගී ගිජුකුලු පව්වේ සැරියුත් තෙරුණ් වැඩ සිටින කුටියට ගොස් කුටිය තුල සුදුසු තැනක දාන පාත්‍රය තැබුවේය. එහි සිටි භික්ෂූන් වහන්සේලාත් සමඟ සැරියුත් තෙරුණ් ලෙඩ ඇඳෙන් ඉවතට ගෙන මද උණු වතුරෙන් ඇඟ පත සෝදා වෙනත් සිනිඳු අඳනයක් සිවුරක්

අන්දවා ආසනයක වඩා හිඳුවා මේ දාන පාත්‍රය ඔඩෝක්කුව මත තබා ''සැරියුත් මහ රහතන් වහන්ස, මෙය වළඳනු මැනවි. ඔබ වහන්සේ ඇතුළු අප කව්රුත් දන්නා කියන ධනවත් - බලවත්, සැදැහැවත් පවුල් කීපයක් මේ ඖෂධීය කිරිබත මා පිඬු පිණිස උදේ වඩිද්දී කැඳවා ගෙන ගොස් - මටද දානය දී මෙම සුවිශේෂ ඖෂධීය කිරිබත ඔබ වහන්සේට පිලිගන්වන්නට යැයි බැගෑපත්ව ඉල්ලා සිටියහ. දැන් මෙය වළඳන සේක්වා''.

දාන පාත්‍රයෙහි පියන ඉවත් කළ විගසම සැරියුත් තෙරුණුවෝ ඖෂධීය කිරිබත දෙස බලා ''ඇවැත්නි, මේ මාගේ මව සකස් කර දෙන ඖෂධීය කිරිබත ම තමයි. සුවඳත් පාටත් ඒ හා සමානමයි. උවමනා බෙහෙත් වර්ග සියල්ලම සංයෝග කොට මේ ඖෂධීය කිරිබත සකස් කොට ඇති බව පේනවා. එනමුදු මේ ඖෂධීය ආහාරය මට අකැපයි. කැප නැහැ. වළදන්නට සුදුසු නැහැ. වැළඳුවොත් එය ධර්ම විනයට විරුද්ධයි. මේ කිරිබත් පාත්‍රය වහා ඉවතට දමනු මැනවැයි'' පවසා මුගලන් තෙරුන් අතටම දුන්නේය. උන්වහන්සේ මේ කිමෙක්දැයි විමතියට පත්ව වහා සමාපත්තියට සිත නංවා කිරිබත ඉවත දමන්නැයි ප්‍රකාශ කළේ, කවර කරුණක් නිසාදැයි දිවසින් බැලුසේක.

මුගලන් තෙරුණුවෝද අකැපයැයි පැවසීමට හේතුව දැන ගත්තේ එවිට ය. ඍධි බල ඇති බුදු - පසේ බුදු - මහරහතුන්ට සෑම දෙයක්ම සෑම විටම දිවසින් පෙනෙන්නේ නැත. අහසින් යාමට හෝ දිවැසින් යමක් දැකීමට හෝ දිව කනින් ඇසීමට හෝ අන් අයගේ සිත් සතන් දැන ගැනීමට හෝ තමන්ගේ හෝ අන් කෙනකුගේ පෙර ආත්ම භාවයන් දැකීමට හෝ ඊට අදාල සමවතට සිත යොමු කොට දැකිය යුතුය - බැලිය යුතුය. මුගලන් තෙරුණ්ට එය කලින් දැනගත හැකි විය. මෙම ඖෂධීය කිරිබත ඉවතට දැමූ විගසම සැරියුත් තෙරුණ්ගේ අර දරුණු ආබාධය සැනෙකින්ම අතුරුදන් විය. හේතුව? අසීමිත සීල බලයයි. මේ තරම් දරුණු වේදනාවකින් ඉවසිය නොහැකි දුකකින් පසුවෙන අවස්ථාවේදී වුවද? උන්වහන්සේ කුඩා සික පදයක් පවා කඩා ගැනීමට -

නොසලකා හැරීමට නොපෙළඹුනේ ය. ඒ සත්‍යමය - සීල බලය තුළින් ඇති වූ ආධ්‍යාත්මික ගුණ ශක්තිය නිසා රෝගය මුගලන් තෙරුණ් දාන පාත්‍රය ඉවතට හලත්ම, සැනෙකින් සුවපත් විය. අතුරුදන් විය. නැවත උන්වහන්සේ පිරිනිවන් පානතුරු ඒ අසනීපය මතු නොවී ය.

දැන් මේ සිද්ධිය කියවන ලද කාටත් විමතියක් ඇති විය හැකිය. මේ තරම් සැලකිලිමත්ව ප්‍රණීත අයුරින්ම ඖෂධ වර්ග යොදා මසුරන් දහස් ගණනක් වියදම් කොට ඉහළම පෙළේ බ්‍රාහ්මණ පවුල් දෙක තුනක් එක්ව පිළියෙල කරන ලද ''ඖෂධීය කිරිබත වහා ඉවත දමන්නැයි, කැප නැතැයි ප්‍රකාශ කිරීමට හේතුව කුමක්ද? ''යන්න ගැනය. අවුරුදු විසි ගණනකට කලින් සැරියුත් මහ තෙරුණ් වහන්සේ විසින්ම පිණ්ඩපාතයේ ගොස් තමන් ලද දානයත්, ලැබී තිබුණු සිවුරු පිරිකරත් සමඟ සඟ සතු කොට පුදා - පින් අනුමෝදන් කළේ ආත්ම පහකට පෙර මවක්ව සිටි ප්‍රේත මාතාවකට ය. එදා දේවත්වයට පත් වූ ඇය - සැරියුත් තෙරුන් රෝගාතුරව සිටි දවස් දෙක තුනද ගත කරන ලද්දී මහත් දුකකිනි. ''මගේ පුතණුවන් දැඩි ලෙස රෝගාතුරව ඇත. උන්වහන්සේ කෙසේ සුවපත් කර ගනිම්දැයි සිත සිතා රැඳී සිටි ඇය - කලින්දා රාත්‍රියෙහි මුගලන් තෙරුණ් ප්‍රමුඛ අනෙකුත් සංඝයා වහන්සේට තම මෑණියන් වූ රූපසාරී බ්‍රාහ්මණ මාතාව පිළියෙල කර දෙන ඖෂධීය කිරි බත ගැන මැනවින් අදෘශ්‍යමානව අසාගෙන සිටියා ය.

අනතුරුව දෙවඟන, සැරියුත් මහ රහතන් වහන්සේට සලකන අර බ්‍රාහ්මණ නිවසෙහි දරුවෙකුට ඒ රාත්‍රියේම ආවේශ වූවාය. දඟලන - කෑ ගහන, පෙරළෙන දරුවා දැක, දැං මේ හොඳට හිටි දරුවාට කුමක් වූවේදැයි නිවසේ පිරිසත් අහල පහළ ගෙවල් දොරවල් වල අයත් කලබයට පත්ව එතනට රැස් වූහ. සිහි විකල් බවින් යුතුව ආවේශ වී සිටි මේ දරුවා ළඟට පැමිනි - කාරණා - කාරණා මැනවින් දන්නා තලතුනා බමුණු කෙනෙක් '' මේ දරුවාට පීඩා කරන්නේ කවුරුන්දැයි තර්ජනාත්මක - සැර කටහඬකින් ඇසුවේ ය. එවිට සිහි විකල් බවින් දඟලන දරුවා තරමක් නිහඬ වී බියට පත්ව කියනුයේ -

''අනේ - මම විපතක් කරන්නට - කරදරයක් කරන්නට ආවා නොවේ. ඔබ සියල්ලන් විසින් මහත් ගෞරවයෙන් සලකනු ලබන සැරියුත් මහ රහතන් වහන්සේ දැඩි ලෙස ගිලන්ව සිටී. උන් වහන්සේ ඒ බරපතල රෝගාතුර බවින් සුවපත් කරවා ගැනීමට නම්, අදාල බෙහෙත ඔබ සැමට දැන්වීමටයි මා මේ දරුවාට ආවේශ වූනේ. මම දෙවඟනක් - සැරියුත් තෙරුන්ගේ පිහිටෙන් ප්‍රේත භාවයෙන් මිදී දේවත්වයට පත් වූ දිව්‍යාංගනාවක්. ඔබ කවුරුත් මේ මේ වර්ගවලට අයත් ඖෂධීය බෙහෙත් ද්‍රව්‍ය යොදා මෙවන් ආකාරයෙන් ඖෂධීය කිරිබතක් සකස් කරනු මැනවි. හෙට දවාලට මුගලන් තෙරුණුවෝ මෙම නිවසට වඩිනවා ඇත. උන්වහන්සේට දානය වළඳවා අනතුරුව එම පාත්‍රය පිරිසිදු කොට පිළියෙල කළ දුර්ළභ ඖෂධීය කිරිබත පූජා කර සැරියුත් තෙරුණ්ට වළඳවනු මැනවැයි කියා දානය පිළිගැන්විය යුතුය. එය ඔබ සැමට මහා පිණක් මේ බෙහෙතින් ම උන්වහන්සේ සුවපත් වනු ඇතැයි'' පවසා දෙවඟන අතුරුදහන් වූවා ය. දරුවාද වහා අවේශවත් බවින් තොර වූයේ ය.

දරුවාගේ ආවේශය නිසා කලින් බියට පත්වුවද, මේ විස්තරය ඇසීමෙන් හා දරුවා සුවපත්වීමෙන් පසු සියල්ලෝම මහත්සේ සතුටට පත්වූහ. අපට මහා පිණක් කර ගැනීමට ලැබුනේයැයි ඒ මොහොතේ පටන්ම බෙහෙත් වර්ග සම්පාදනය කර ගෙන පසුදා උදෑසන දෙවඟන කී පරිදිම කිරිබත පිසන ලදහ. මහ මඟ වඩින මුගලන් තෙරුන් ගෙදරට වැඩමවාගෙන පැමිණි අර වර්ණවත් - පැහැපත් තරුණ කුමරිය අන් කිසිවෙක් නොව, ඒ දිව්‍යයාංගනාවම ය. මේ කථා ප්‍රවෘත්තියෙන් පැහැදිලි වන්නේ මිය ගිය ඥාතීන් අපෙන් පිං ලබා සැපවත් වූ විට අපගේ දුකට සැපට පිහිට වන ආකාරයයි. ''පේතාන පූජාච කථා උළාරා'' යනුවෙන් තිරෝකුඩ්ඩ සූත්‍රයෙහි පෙන්වා දී වදාළ සේක්ද, මේ කාරණයමැයි. දනුදු විවිධ කුසලක්‍රියාවන් සිදු කොට - පිං අනුමෝදන් කර වීම නිසා, සැපතට පත් - දේවත්වයට පත් ඤාතීහු පිහිට වූ අය ගැන සොයන්නේ බලන්නේ නැතැයි කිව නොහැකි ය.

අර තරම් වියදමක් දරා වැදගත් බමුණු පවුල් රැසක් එක්ව දැඩි වෙහෙසකින් දේව දිෂ්ඨියෙන් කී ලෙසම, පිළියෙල කළ ඖෂධීය කිරිබත වහා ඉවත දමන්නැයි සැරියුත් තෙරුන් මුගලන් තෙරුන්ට සැපසුවේ කවර කරුණක් නිසාදැයි දැන් කාගේත් සිත් වල කුතුහලයක් පවතිනවාට සැක නැත. දෙවඟන දරුවෙකුට ආවේශ වී එහි කළබැගෑනියක් - නොසන්සුන්තාවයක් සිදු කරන ලදී. එසේ කිරීමෙන් පිළියෙල කළ දානය කැප නැත. එය අනිසි පෙළඹවීමකින් සැකසූ දානයක් බැවිනි. මුගලන් තෙරුන් වහන්සේ වඩින විට කවුරුන් හෝ ''ස්වාමීනි මුගලන් මහ රහතන් වහන්ස, සැරියුත් මහ රහතන් වහන්සේ දැඩිව රෝගීව සිටින බව දැනගන්නට ලැබුණා. උන්වහන්සේට අවශ්‍ය බෙහෙතක් - කසායක් - ඖෂධයක් සකසා දීමට කරුණා කර අපට කියනු මැනවි.'' මෙසේ අසා දැනගෙන පිළියෙල කරදුන් දානයක් - බෙහෙතක් කැපය. දැනුදු අපගේ දායක පින්වතුන් සඟරුවනට බෙහෙතක් - දානයක් සකසා පූජා කරන්නේ ඒ ආකාරයෙනි. එබඳු දානයක් - පිලියෙල කරදුන් දෙයක්, ලබා ගැනීම කැපය. ඖෂධීය කිරිබත ඉවත ලන ලෙස පැවසුවේ එය එසේ සිදුනොවූන නිසාය. ඉහත කී පරිදි අනිසි මෙහෙයවීමකින් පිළියෙල කරන ලද්දක් නිසාය. සිල්වත් ගුණවත් පැවිදි උතුමන්ගේ ස්වභාවය මේ සැරියුත් කථා පුවතින් මනාව පැහැදිලි වෙති. මෙහෙදී බෙහෙතට වඩා සිල්වත් කමේ බළය ඉස්මතු වූ ආකාරය පැහැදිලි වේ.

ඉහත සඳහන් කථාවේ සැරියුත් තෙරුන් ප්‍රේත මාතාවට පින් දීමේ සිද්ධිය ප්‍රේතවත්ථු පපුකරණයෙහි ද- දෙවඟනගේ සැලකීම විසුද්ධි මාර්ගයෙහි සීල නිර්දේශයෙහි ද දක්වා ඇත.

''බලංච භික්ඛු න මනුප්පදින්නං - තුම්හේහි පුඤ්ඤං පසුතං අනප්පකං'' යනුවෙන් කියැවෙන්නේ සිල්වත් - ගුණවත් මහා සංඝයාට, නැති බැරි අයට, තිරිසන් ගත සතුනට පවා මෛත්‍රී සහගත සිතින් යුතුව මියගිය ඥාතීන් සුවපත් කරනු සඳහා කුසල් කිරීමෙන් ඒ දායකයනටද සසර වසනතුරු සැප විපාක ලබා දෙන මහත්ඵල මහානිසංස දායී පිණක්

ලැබෙන බවය. එය නිවනටද හේතු වන්නේ ය. මෙතෙක් දැක්වූ කරුණු වලට අනුව මියගිය ඥාතීන් සුවපත් කරන ආකාරය පැහැදිලි වන්නේ ය.

## දෙන පින් ලබන්නෝ

සෑම රටකම බෞද්ධ ජනතාව කලින් සඳහන් කළ පරිදි තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් කුසල කර්මයන් - මිය ගිය ඥාතීන්ට පිං දීමේ බලාපොරොත්තුවෙන් සිදු කරති. එසේ වුවද ඒ පින ඉබේම නොලැබෙන්නේ ය. පිනක් සිදුකොට අවසානයේදී එම කුසල බලය ඥාතීන්ට අනුමෝදන් කර විය යුතුය. ඒ සඳහා තමන්ගේ සිතද තමන්ගේ වචනයද - තමන්ගේ ශරීරයද සම්බන්ධ කර ගත යුතු ය. දෙන පින ශක්තිමත්ව මිය ගිය ඥාතීන්ට ලැබෙන්නේ එවිට ය. දානයක් හෝ වෙනත් පිංකමක් කොට සියල්ලෝම තැන්පත්ව වාඩි වී පිරිසිදු පැදුරක් මත පිරිසිදු සුදු වස්ත්‍ර කැල්ලක් එලා ඒ මත පැන් වඩන පිඟාන, කෝප්පය සහ කෙන්ඩියද ඉතාමත්ම පිරිසිදු විය යුතු ය. කෝප්පයකට අල්ලන වතුරට වඩා කෙන්ඩියෙහි පැන් තිබිය යුතු ය. අපේ බෞද්ධ රට රාජ්‍යවල එනම්, මියන්මාර්, තායිලන්ත, කාම්බෝජ, ලාඕස්, ආදී දේශවල ගනු ලබන්නේ ඉතාමත්ම පිරිසිදු ජලය නැත්නම් කුරුම්බා වතුර පැන් වැඩීමට ගැනීම සිරිතකි. එයින් අදහස් කරන්නේ, පිරිසිදු - නොයිඳුල් බව ය. මේ වන විට දායක භවතුන්ගේ සිත් සතන් පිංකම නිසා ඇතිවුණු කුසල චේතනාවන්ගෙන් අතිශයින්ම පිරිසිදු බවට පත්ව ඇත. ප්‍රථමයෙන්ම පන්සිල් සමාදන්ව පිංකම කිරීම නිසා ආනිසංස වැඩි වන්නේ ය.

සිල්වත්ව පහන් සිතින් යුතුව දායක භවතුන් තැන්පත්ව වාඩිවී පවුලේ කීප දෙනෙක් පැන් භාජනය අතට ගෙන ටිකටික පැන් වැඩිය යුතු ය. මේ අවස්ථාවේදී සියල්ලෝම මහත් වූ කරුණා චේතනාවන්ගෙන් සිත පිරිසිදු කරගත යුතු ය. අප විසින් සිදු කරගත් මේ මහා පුණ්‍ය

බලයෙන් ''අපට උපකාරවත්ව සිට අභාවප්‍රාප්ත අයගේ නම් ගම් ද කියමින් අප දන්නා නොදන්නා අපෙන් පින් බලාපොරොත්තු වන සියල්ලන්ටම මේ කුසල බලයෙන් දිව්‍යමය සැපයක්ම ලැබේවායි. පිරුණු කරුණා හදවතින් පැන් වැඩිය යුතු ය. පැන් වැඩීමේදී තිරොකුඩ්ඩ සූත්‍රයෙහි එන ''ඉදංමේ ඤාති නංහෝතු -සුඛිතා හොන්තු ඤාතයෝ'' යන ගාථාව තුන් වරක් නොව හතර පස් වතාවක් කීවද වරදක් නැත. මේ ගාථාව කියමින් පැන් වඩා පිං අනුමෝදන් කරවීමට ගත වන්නේ විනාඩි තුනක පමණ කෙටි කාලයකි. ඒ කෙටි වේලාව තුළ තමන්ගේ හිතත් - තමන්ගේ වචනයත් - තමන්ගේ ශරීරයත් මේ පින් අනුමෝදන් කර වීමට යොමු කර ගත යුතු ය. පැන් වඩන විට අනෙක් සියල්ලෝම එකම කරුණා සිතකින් යුතුව ගාථාව නිසි පරිදි උච්චාරණය කොට පිළිවෙළකට කිව යුතු ය. ගේ තුළ පිං අනුමෝදන් කරන්නේනම්, ගෙයින් පිටතට - මිදුලේත් තරමක් ඈතට ඇසෙන පරිදි ගාථාව සියල්ලෝම තරමක් ශබ්ද නගා කිව යුතු ය.

අපේ අට්ඨ කථාවන්හි දක්වා ඇත්තේ ඉස්බක් පමණ ඈතට ඇසෙන පරිදි මේ පැන් වඩන ගාථාව ක්‍රමවත්ව කරුණාවෙන්ම සියල්ලෝම එකට කිව යුතු බව ය. ඉස්බ යනු බඹ තිස් පහක දුරකි. එයින් අදහස් කරන්නේ, ගේ අවට සිටින කෙනෙකුට ඇසෙන පරිදි කිවයුතු බව ය. පරදත්තුපජීවි ප්‍රේත භවයට වැටුනු අය පිං ගැනීමට බලාපොරොත්තුව පැමිණෙති. ඔවුන්ගේ ස්වාභාවය - අතිශයින්ම විරූපයි - දුක්ඛිතයි - අසරණයි - අපවිත්‍රයි - චුර්ගන්ධයි. එනිසා තමන්ගේ ස්වභාවය තව කෙනෙකුට පෙන්වීමට කැමති නැත. සමහර ප්‍රේතයන්ට එසේ පෙනී සිටීමට ද නොහැකි ය. අප දැන් ජීවත් වන්නේ මිනිස් ලෝකයේ බැවින් එය සුගතියකි. සැපවත් තැනකි. කලින් මිත්‍රාදි හිතවත් කම් පැවතිය ද, දැන් ඒ ප්‍රේතයනට අප ලඟට පැමිණිය නොහැකි ය. අප ඉන්නේ සුගතියක බැවිනි. මිනිස් ලොව සුගතියකි, දිව්‍යලෝක - බ්‍රහ්මලෝක ඊටත් වඩා ඉහළ සුගති සංඛ්‍යාත ලෝකයෝ ය. දුගති සංඛ්‍යාත ප්‍රේත භවයේ සිටින කෙනෙකුට සුගති සංඛ්‍යාත පින්වත් මනුෂ්‍යයන්ට ලංවිය නොහැකි ය. ''ඉදං මේ ඤාති නංහෝතු''

යන ගාථාව එළියට පහළියට ඇසෙන සේ කිව යුතු වන්නේ ද ඒ නිසා ය.

පැන් වැඩීමේදී ද ඉක්මනින් පැන් ටික වත් කිරීමට කලබල නොවී සන්සුන්ව තැන්පත් සිතින් ගාථාව කියමින් කරුණා සිත් ඇතිව පැන් වැඩීම කළ යුතු ය. මෙයින් පැහැදිලි වන්නේ සිතත් - වචනයත් - ශරීරයත් තුනම පැන් වැඩීමේදී සම්බන්ධ කර ගත යුතු බවයි. ඒ විනාඩි දෙක තුනක කාලය තුළ පිංකමට රැස් වූ සියල්ලෝම එකම සිතින් මෙසේ පැන් වඩා පින් දෙන විට එය ශක්තිමත් මනෝමය බලවේගයක් බවට පත්වන්නේ ය. පින් බලාපොරොත්තුවෙන ඥාතීන්ට පිං නිසිසේ අනුමෝදන් වීමට ප්‍රමුඛතම පිහිට බවට පත්වන්නේ එයම බව සැළකිය යුතු ය. අනෙක් බෞද්ධ රටවල පැන් වඩන විට ගාථාව අතිශයින්ම සිත් ගන්නා ස්වරූපයෙන් ලයාණ්විතව සියල්ලෝම ප්‍රමාණවත් හඬකින් යුතුව එකටම කියති. ඇතැම් රටවල එක් එක් ප්‍රදේශයන්හි පැන් වැඩීමේදී කියන මෙම ගාථාව බඹ තිස් පහක් නොව බඹ හැට හැත්තෑවක් ඈතට ඇසෙන පරිදි කියති. ඒ ඔවුන්ගේ වැඩි ශ්‍රද්ධාවයි.

අපේ රටේ චාරිත්‍රය වන්නේ පැන් වඩන විට එහි රැස් වූ සියල්ලෝමද ගාථාව කීම ය. පෙරකී පරිදි අනෙක් රටවල සමහර ප්‍රදේශවල පිං දීමේදී පැන් වඩන දෙතුන් දෙනා ලඟ සිට සියල්ලෝම එකිනෙකාගේ ඇඟට අත තබා ගනිති. තරමක් දුරින් සිටි කෙනෙක් වුවද පැන් වඩන ඒ විනාඩි දෙක තුළ අනෙක් කෙනාගේ ලඟට පැමිණ නොකැඩී වැළක්සේ පවතින අයුරින් ඇඟට අත තබා ගනිති. එය පැන් වඩන මොහොතට පමණක් සීමා වූවකි. එයින් අදහස් කරන්නේ මිය ගිය ඥාතීන්ට පිං අනුමෝදන් කිරීමේ මේ මහා පුණ්‍ය කර්මයට සහභාගි වූ ''අප සියල්ලෝමද' සිතෙන් - වචනයෙන් පමණක් නොව ශාරීරික - කායික වශයෙන්ද පිං දීමට සම්බන්ධ වන බව ය. පැන් වඩන මොහොතේ ඔවුනොවුන්ගේ ඇඟට අත තබා ගැනීම පමණක් නොව - ගේ තුළ පැන් වඩන විට මිදුල - එළිය පැත්තට ඇති දොර ජනෙල්ද නිසි පරිදි විවෘත කොට, දොර ජනෙල් තිර පවා ගැටගසා එළියේ අදෘශ්‍යමානව සිටින ඒ භූතයනට පෙනෙනු

පිණිස පින්දීම ඔවුන්ගේ සිරිතකි. මේ අනුව ගෙයින් පිටත සිටින අපට නොපෙනෙන ඒ අදෘෂ්‍යමාන පින් ගන්නට රැස්ව ඇති භූතයනට ඇසෙන පරිදි - පෙනෙන පරිදි මේ පුණ්‍යක්‍රියාව සිදු කිරීම ඒ රටවල චාරිත්‍රයයි. බුරුම, කාම්බෝජ, ලාඕස්, තායි ආදී ඇතැම් දේශවල පැන් වැඩීමට කලින් උදේ කාලයේ කෙනෙක් කථා නොකොට පොල් ගහකට නැග කුරුම්බා ගෙඩියක් හෝ දෙකක් කඩාගෙන බිම නොදමා අතින් රැගෙන ගසින් බසිති. ඒ කුරුම්බා ගෙඩිය හෝ දෙක බිම නොතබා - උඩක පැන් වැසීමට මොහොතකට පෙර ඇස්ස කපා ඒ කුරුම්බා වතුර තබා පැන් කෙන්ඩියට පුරවා ගනිති. පැන් වැඩීමට ගන්නේ ඒ පිරිසිදු මේ කුරුම්බා වතුර ය. මේ සියල්ල බුදුරජාණන් වහන්සේ දේශණා කරන ලද කරුණු ම නොවේ පසු කාලවල ඒ ඒ රටවල සැදැහැවත් ගිහි පැවිදි භවතුන් විසින් වඩාත් පිරිසිදුව ගැඹුරු හැඟීමකින් යුතුව මේ උත්කෘෂ්ඨ කුසල ක්‍රියාව සිදු කරනු පිණිස පවත්වාගෙන එන චාරිත්‍ර ධර්මයන් බව සැලකිය යුතු ය. වඩාත් මෙසේ සිදුකරනු ලබන්නේ අතිශයින්ම පිරිසිදු ජලය සොයාගත නොහැකි ප්‍රදේශ වල ය.

## නිවැරදිව පින්දීම

ඉහත සඳහන් කළ කරුණු අනුව පැහැදිලි වන්නේ ඥාතීන්ට පින් දීමේ බලාපොරොත්තුවෙන් දානාදි පුණ්‍ය ක්‍රියාවක් කළ පමණින් ම ඉබේම ඔවුනට අප කරගත් පින නොලැබෙන බව ය. වෙහෙස මහන්සි වී - විය පැහැදම් කරගෙන - මහත් වූ ආශාවකින් යුතුව පිං කමක් කළ විට ඒ පිනේ ආනිසංසය ලැබෙන්නේ කුසලය කරගත් භවතුන්ට ය. ඔවුන් විසින් තමන් අත් කරගත් මහ කුසල බලය තමන්ගේ සිතත් තමන්ගේ වචනයත් - තමන්ගේ කයත් එකසේ යොමු කරගෙන පෙර කී සේ පිරුණු කරුණා හදවතකින් යුතුවම පින අනුමෝදන් කළ යුතු ය. මහත් වූ කරුණාවක් තම සිත් සතන් තුළ පහළ වන විට සිත පිරිසිදු ය. ඉමහත් කරුණාවකින් යුතුව පින් කමක් සිදු කර ගැනීමට කලක් ගත

විය හැකි ය. මහත් වූ වෙහෙස මහන්සියක්ද දැරිය යුතුව ඇත. ලොකු වියපැහැදමක්ද කර ගත යුතුව තිබේ. මෙසේ පිංකමක් යොදා කියා ගැනීමට - සිදු කර ගැනීමට කලක් ගතවුවද, තමා උපදවා ගත් පින ඤාතීන්ට අනුමෝදන් කිරීමට ගත වන කාලය කලින් සඳහන් කළාක් මෙන් විනාඩි තුනක් පමණ ය. මේ කියන්නේ ''ඉධං මේ ඤාති නංහෝතු'' යන ගාථාව තුන් හතර වතාවක් සංසුන්ව කීමට ගතවන කාලයයි. ඒ විනාඩි තුන තුළ සියල්ලෝම එකම අරමුණක හිත පිහිටුවා ගෙන තම තමන්ගේ මුවින් - එකසේ ගාථාව කියමින් ගෙදර සහ ලේ ඤාති කීප දෙනෙක් පැන් භාජනය අතින් ගෙන එකම ඉරියව්වකින් - එකම ආකාරයට පින් අනුමෝදන් කරන විට ඒ ස්වල්ප මොහොත තුළ ඇතිවන මනෝමය බලවේගය කියා නිමකළ නොහැකි තරම් බලවත් ය. ශක්තිමත් ය. එනිසා පින් අනුමෝදන් කිරීමේදී මේ සඳහන් කළ කරුණු ටික තදින්ම සිතට ගත යුතු ය. එවන් අයුරින් සිත - කය - වචනය පිහිටුවාගෙන පින් දීමෙන් තමන්ගේ උදාර කුසලය අංග සම්පූර්ණ වන්නේ ය.

fuy§ ie,lh h; jeo.; lreKl ;fí' wfm fn!oO ck;dj fldf;l; ñh .h {d;k fjkfjk mklï iÿ l<o" by; i|yk l< pdß;hk imrd bg fkdlr;' fndfyd ;ekj, ki f,i ih,f,du mek jeãfï§ .d:dj WÉpdrK fldg fkdlh;' fjk fohl .ek y; fhdulrf.k .d:dj lfuk fok mk Yl;u; fkdfõ' fndfyd ;ekj, odkfhkmi hk tk [d; ñ;d§kg ie,lu m<n|j i;kjd ñi fï Wodr j.lu .ek fkdi,lkfkdh' tfiu mek jeãfï§ o tl mdrgu j;r ál ye,u iß;l' th c,h ye,ul fkdfõ' mek jeãul' mßiÿ mek - mßiÿ i;k h;j i,hl mygd b|f.k mrf,dj whgwk fudok lÍul' t wji:djg iïnkO j ih,f,d u fujek mßiÿ udkil ;;jhl mygd iguy; j lreKdfjk zzfï mfkk wmf. ñh .h {d;kg iem;lu fõjdhZZ tlg m;k úgwe;jk ufkduhn, fõ.hl,ku; l l<dl fuk lhdku fkdl<yel ;rïn,j;h'

පින්කමක් කරන අවස්ථාවලදී හිත නරක් වෙන ප්‍රශ්ණ මතුවෙයි. පින් කම ආරම්භයේ පටන්ම අවසානය දක්වා කලකිරීමක් ඇති කර නොගෙන මොනම හේතුවක් නිසාවත් සිත දූෂ්‍ය බවට පත්කර නොගෙන පින්කම නිමකර ගත යුතු ය. පින් කමක් කිරීමට පෙරද සතුටු සිතින්ම ඒ පිංකමට සූදානම් විය යුතුයැයි දක්වා ඇත්තේ එහෙයිනි. පූර්ව චේතනාව යනු එයයි. එසේම පින්කම කරන අවස්ථාවේදීද සිත පැහැපත්වමම පවත්වා ගත යුතුය. එපමණක් නොව පින්කම කිරීමෙන් පසුවද, ''මම මෙබඳු පින්කමක් කර ගත්තෙමි'' යැයි සිහිපත් වෙන සිහිපත් වෙන වෙලාවට සතුටක් ම උපදවා ගත යුතුය. තුන් සිත පහදවාගෙන පිංකම් කළ යුතු යැයි දේශනා කර ඇත්තේ එනිසා ය.

**''පුබ්බේව දානා සුමණා භවාම -**
**දදම්පි චේ අත්තමනා භවාම**
**දත්වා පි චේ නානු තප්පාමි පච්චා -**
**තස්මා හි අම්හං දහරා න මියරේ.''**

පින්කමක් කිරීමට පෙර ද, කරන අවස්ථාවේදී ද, කිරීමෙන් පසුව ද යන තුන්සිත පහදවාගෙන පින්කම් කිරීමෙන් ලැබෙන එක ආනිසංසයක් නම්, සාංසාරික වශයෙන් කවරදාකවත් අකාලයේ අභාවයට යන දරුවන් - ස්වාමි පුත්‍රයන් සහ භාර්යාව න් ඇති නොවන බවය. දරුවන් ඇතුළු තම පවුල්වල අය අකල් මරණ වලට පත් නොවී නිසි වයස්ම ජීවත්ව සිට අභාවයට පත්වෙති. මේ කාරණය මහා ධර්මපාල ජාතකයේදී පැහැදිලිව දක්වා ඇත. ඒ අනුව තමන් කරණ කියන යහපත් දේ පිළිබඳව පැහැදිලි හැගීමක් ඇතිව තුන්සිත පහදවාගෙනම සිදු කිරීමට සෑම කෙනෙක්ම උත්සාහවත් විය යුතු ය.

මෙතෙක් දක්වන ලද්දේ මියගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීමේදී පිළිපැදිය යුතු ආකාරය ගැන ය. තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් කුසල කර්මයන් සිදු කොට මියගිය, මව් - පිය - ගුරුවරුන් - භාර්‍යාවන් - දරුවන් - ස්වාමි

පුරුෂයන් - සහෝදර සහෝදරියන් සහ තමනට හොඳටම හිතවත්ව සිට - උපකාරවත්ව සිට මියගිය අයට උපදවාගත් පින අනුමෝදන් කරවීම ඉහත සඳහන් ආකාරයෙන් ම හිතත් - වචනයත් - කයත් නිසි පරිදි යොමු කොටගෙන ම අනුමෝදන් කරවීමට අමතක නොකළ යුතුම ය. ඒ ඒ පින්කම් කොට නිමවූ අවස්ථාවන්හිදී ඇතිවන හිත නරක් වෙන ප්‍රශ්න නිසා දූෂිත වූ සිතින් යුතුවනම්, පින් අනුමෝදන් කිරිමක් කවර වේලාවකවත් නොකළ යුතු බව තරයේම කියා සිටිය යුතුව තිබේ. හේතුව? මේ තරම් උතුම් පැතුමකින් මහා පරිශ්‍රමයක් දරා රැස් කර ගත් කුසල බලය, අවුල් සහගත සිතකින් යුතුව ගාථාව කියා පැන් වඩා අනුමෝදන් කළද පරදත්තුපජීවි භවයෙහි වැටී - පින් බලාපොරොත්තුව එන ඤාතීන්ට නියම ආකාරයෙන් අනුමෝදන් විය නොහැකි බැවිනි.

මියගිය අය වෙනුවෙන් නොවරදවාම පිනක් දහමක් කොට පින් අනුමෝදන් කළත් - ඉහත සඳහන් කරුණු පිළිබඳව මනා සැලකිල්ලක් නොදක්වන බැවින්, මෙතරම් ඕනෑකමකින් යුතුව මෙකී කරුණු ටික පැහැදිලි කරන ලද බව සැලකිය යුතු ය. බුදුරදුන් ලොව පහළ විමට පෙරද මියගිය ඤාතීන් සිහිපත් කළ අයුරු පැරණි පොත පතෙහි සඳහන්ව ඇත. ඇත කාලීන මිනිස්සු විශ්වාස කළෝ, ලෝකය පවතින්නේ දෙවියන්ගේ කැමැත්ත අනුව බවයි. ලෝකයේ සිදුවෙන සෑම දෙයක්ම ලොව මවන ලද - ලොව රකිනු ලබන දේව අදහසට අනුව සිදුවන්නක් බැවින්, මිය යන සියල්ලෝද දේවත්වයට පත්කළ හැක්කේ ඒ දෙවි දේවතාවුන් සතුටු කර වීමෙන් ය. එබැවින් ඔව්හු දෙවියන් සතුටු කරවනු පිණිස තම තමනට කළහැකි පමණින් ගවයන් - එළුවන් - කුකුළන් ආදී සතුන් මරා ඒ සතුන්ගෙන් ලේ රැගෙන දෙවි දේවතාවන් වඳින පුදන තැන්වල තබා බ්‍රාහ්මණයන් ලවා ස්තුති ගීතිකා කියවා දෙවියන්ට කැප කළහ. එවිට දෙවියෝ, තමන් වෙනුවෙන් කළ මේ ලේ පූජාවන් නිසා සතුටට පත්ව, මිය ගිය ඤාති වරයා දේවත්වයට පත් කරන්නෝ ය. සතුන් මරා යාග හෝම පවත්වන්නට ආරම්භ වූයේ මේ පදනම ඇතුව ය. ඇතැම් අවස්ථා වලදී බලගතු රජවරු - සිටුවරුද සතුන් සිය දහස්

ගණන් කැප කොට දෙවියන් පිදීමට කල්පනා කලහ - පුරුදු වූහ. දඹදිව බ්‍රාහ්මණ සමාජයට අයත් භවතුන්ගේ ප්‍රධානම ආගමික කාර්යය වූයේත් මෙයයි.

බුදුරදුන් ලොව පහළ වූ සේක්, මෙබඳු වකවානුවක ය. උන්වහන්සේ මහා කරුණාවෙන් යුතුව දේශණා කරන ලද්දේ ප්‍රාණඝාතාදිය කොට රුධිර පූජාවන් කිරීමෙන් සතුටු වන දේව පිරිසක් නැති බවත්, එබඳු පූජාවන්ගෙන් සතුටු වන්නෝ, යක්ෂ - ප්‍රේත - භූත - පිසාච - කුම්භාණ්ඩ - අසුර - රාක්‍ෂාදී අමනුෂ්‍යයන් බවත් ය. එනිසා එවන් පාපක්‍රියාවන්ගෙන් වැළකී කරුණා පෙරදැරිව දානාදී කුසල ධර්මයන් වඩා, ඒ කුසල් මිය ගිය ඥාතීන්ට අනුමෝදන් කළයුතු බවත් ය. ඒ අනුව මේ පොතේ මුලදී දක්වන ලද පරිදි බුදුපියාණෝ බිම්බිසාර මහාරාජයාට මිය ගිය අයට පින්දෙන පිළිවෙත පැහැදිලිව වදාළ සේක. බිම්බිසාර මහාරාජයාට වදාරන ලද තිරොකුඩ්ඩ සූත්‍රය මෙතැන් සිට දක්වනු ලැබේ.

## තිරොකුඩ්ඩ සූත්‍රය

**1. තිරොකුඩ්ඩෙසු තිට්ඨන්ති - සන්ධි සිංඝාට කේසු ච**
**ද්වාර බාහාසු තිට්ඨන්ති - ආගන්ත්වාන සකං ඝරං**

මහරජතුමනි, පින් ගැනීමට බලාපොරොත්තු වෙන ඥාති වරයෝ පරදත්තූපජීවී ප්‍රේත භවයෙහි සිට එදා පැවති තම නැකම් ගැන සලකා - පින් බලාපොරොත්තුව ගෙවල් දොරවල් අසල රැදී සිටින්නා හ. සමහර විට ගෙට හැරෙන තැන්වල - වැට අයින්වල - දොර - ගේට්ටු අසල ද අදෘෂ්‍යමානව සිටිය හැකි ය.

**2. පහූතේ අන්නපානම්හි - ඛජ්ජ බොජ්ජෙ උපට්ඨිතෙ**
**න තේසං කෝචි සරති - සත්තානං කම්ම පච්චයා**

පරදත්තූපජීවී භවයෙහි උපත ලද ඒ මියගිය ඥාතීන්ට අනුග්‍රහ පිණිස ප්‍රනීත වූ ආහාරපාන පිළියෙල කොට දන්දී ඒ කුසලය බරපතල පාපකර්මයන්ගේ විපාක වශයෙන් ප්‍රේත භවයට වැටී ඇති ඒ දුක්ඛිත ඥාතීන්ට අනුමෝදන් කළ යුතු ය.

**3. ඒවං දදන්ති ඤාතීනං - යෙ හොන්ති අනුකම්පකා**
**සුචිං පණීතං කාලෙන - කප්පියං පාන භෝජනං**

කෙලෙහිගුණ දන්නා සැදැහැවත්හු ඉහත දැක්වූ පරිදි පිරිසිදුවත් ප්‍රනීතවත් ආහාරපාන කැපසරුප් පරිදි පිළියෙල කොට සිල්වත් ගුණවත් උතුමන්ට දන් දී

**4. ඉදං වෝ ඤාතීනං හෝතු - සුඛිතා හොන්තු ඤාතයෝ**
**තෙ ච තත්ථ සමාගන්ත්වා - ඤාතිපෙතා සමාගතා**

අපගෙන් පින් බලාපොරොත්තුව රැස්ව ඇති ඤාති ප්‍රේතයෝ අපි සිදු කරගත් මේ මහානිසංස දානමය පින අනුමෝදන්ව සුවපත් වෙත්වායි - දිව්‍ය ගතියට පත්වෙත්වායි ප්‍රාර්ථනා කළ යුතු ය.

**5. පහුතෙඅන්නපානම්හි - සක්කච්චං අනුමොදරේ**
**චිරං ජීවන්තු නො ඤාති - යේයං හේතු ලභාමසෙ**

මහත් වූ වෙහෙස මහන්සියකින් යුතුව අගනා පිනක් රැස් කොටගෙන අපට අනුමෝදන් කළාවූ මේ පිරිස බොහෝ කාලයක් ජීවත් වේවා. නිරෝගී සැප ලබත්වා. ඔවුන්ගේ දූ දරුවන්ට ද සෙතක්ම වේවායි. පින් ලැබූ ඤාති ප්‍රේතයෝ දේවත්වයට පත්ව සෙත් පතන්නාහු ය.

**6. අම්හාකංච කතා පූජා - දායකාච අනිප්ඵලා**
**නහි තත්ථ කසී අත්ථි - ගොරක්කෙත්තංන - විජ්ජති**

ඒ පරදත්තූපජීවී ප්‍රේත භවයෙහි ගොවිතැන් කර කියා ගැනීමක් නැත. ගවපාලනයක් ද නැත. වෙනත් කිසිදු ලැබීමක් ද නැත. එනිසා අපි දෙන පිනෙන්ම ඔව්හු සැපතට පත්වෙති. එනිසා මේ පින් දීම අපට මහත් වූ කුසලයකි. ලාභයකැයි සිතිය යුතු ය.

**7. වණිජ්ජා තාදිසි නත්ථි - හිරඤ්ඤේන කයාක්කයං**
**ඉතො දින්නේන යාපෙන්ති - පෙතා කාල කතා තහිං**

තව ද, ඒ ප්‍රේත ලෝකයෙහි වෙළහෙළඳාම් ක්‍රම ද නැත. රන් රිදී මුතු මැණික් මිල මුදල් ද නැත. එනිසා ඒ දුක්ඛිත භවයට වැටුණු අපගේ ඤාතීහු ''ඉතෝ දින්නේන යාපෙන්ති''

මිනිස් ලොව සිට දෙනු ලබන පිනකින් ම - කුසලයකින් ම සැපවත් වන්නෝ ය. වෙනත් පිළිසරණක් ඔවුනට නැත.

**8. උන්නමෙ උදකං වට්ඨං - යථා නින්නං පවත්තති**
**එවමේව ඉතො දින්නං - පේතානං උපකප්පති**

කන්දකට ගලා හැලෙන වර්ෂා ජලය කඳු පල්ලමට වහා ගලාගෙන එන්නාක් මෙන්, මිනිස් ලෝකය නැමැති උස් බිම්හි සිට අපි අනුමෝදන් කරවන පිණ ඒ පහත් බිම සිටින දුක්ඛිත ඤාති ප්‍රේතයින්ට ඉතා පහසුවෙන් ලැබෙන්නේ ය.

**9. යථා වාරිවහා පූරා - පරිපූරෙන්ති සාගරං**
**එවමේව ඉතො දින්නං - පෙතානං උපකප්පති**

තවද, ඇළ දොළ ගංගා ජලය ගලාගෙන ගොස් මහා සමුද්‍රයෙහිම රැස් වන්නාක් මෙන්, දෙන පින් ඒ ප්‍රේතයින්ට නොඅඩුවම ලැබෙන්නේ ය.

**10. අදාසි මෙ අකාසි මෙ - ඤාති මිත්තා සඛාච මෙ**
**පේතානං දක්ඛිණං දජ්ජා - පුබ්බේ කතමනුස්සරං**

අපි අද පින් අනුමෝදන් කරනු ලබන ඒ අපේ ඤාතිවරයා නැත්නම් ඤාතීහු අපට මේ මේ උපකාර සිදුකොට ඇත. ඒ මියගිය ඤාති මිත්‍රාදීහු අපට ඉඩකඩම් ලබා දීමෙන් මිළ මුදල් සපයා දීමෙන් ලෙඩට දුකට බැලීමෙන් අපගේ දියුණුවට අදාල අධ්‍යාපන කටයුතු සලසා දීමෙන් බොහෝ උපකාර කොට ඇත. මෙසේ මියගිය අයගේ ගුණ සිහිපත් කරමින් පින් අනුමෝදන් කළ යුතු ය.

**11. නහි රුණ්ණංව සොකො වා - යාචඤ්ඤා පරිදෙවනා**
**නතං පෙතානමත්‍ථාය - එවං තිට්ඨන්ති ඤාතයෝ**

කෙනෙකුගේ මරණය නිසා හඬ හඬා ඉඳීමෙන් තමනට කිසිදු ප්‍රයෝජනයක් නැත. දුක්වීම් විලාප කීම්ද තමන්ටවත් මියගිය මෑණියන්ට - පියාණන්ට - ස්වාමිපුරුෂයාට - භාර්‍යාවට - දරුවාට - සහෝදරයාට හෝ සහෝදරියට හෝ වැදගම්මක් නොවන දෙයකි. ඔවුනට එයින් සතුටක් හෝ සැනසිල්ලක් නොලැබෙන නිසා ය.

**12. අයඤ්ච බෝ දක්ඛිණා දින්නා - සංඝම්හි සුප්පතිට්ඨිතා**
**දීඝරත්තං හිතායස්ස - ඨානසො උපකප්පති**

සිල්වත් ගුණවත් මහා සංඝයා වහන්සේ විෂයෙහි සැදැහැ සිතින් සිදුකරන ලද ප්‍රාප්ති දානමය පින ඉහත කී පරිදි නිසිලෙස අනුමොදන් කළ විගසම ඒ පින බොහෝ කාලයක් ඔවුනට හිත සැප පිණිසම පවතින්නේ ය.

**13. සො ඤාති ධම්මෝච අයං නිදස්සිතො**
**පෙතාන පූජාච කතා උළාරා**
**බලඤ්ච භික්ඛුන මනුප්ප දින්නං**
**තුම්හේහි පුඤ්ඤං පසුතං අනප්පකං**

තවද මෙවන් ආකාරයෙන් දැහැමින් උපයා සපයා ගත් දෙය වැය කොට කරුණා මෛත්‍රී සිතින් යුතුව මියගිය අයට පින් අනුමෝදන් කිරීමේදී ශිෂ්ඨ සම්පන්න මිනිස් ධර්මයක්ද තමා පිළිබඳව කාටත් පැහැදිලිව පෙනෙන්නේ ය. එය තමන්ගේ දියුණුවට උපකාරයකි. මොවුහු කෙළෙහි ගුණ සලකන පරිත්‍යාගයට කැමති පිරිසක්ය යන හොඳ නාමයක් කා අතරත් ඇතිවීම එයට හේතුව යි.

මියගිය ඥාතීන්ටද දෙන පිං අනුමෝදන් වීම නිසා දිව්‍යමය මහා සැපතක් ලැබෙන්නේ ය. එහි ඇති වටිනාකම අපරිමිත ය. දුකටපත් අය සැපතට පත් කිරීම මහා පුණ්‍ය කර්මයකි. සසර වසනතුරු දිව්‍ය - මනුෂ්‍ය - බ්‍රහ්ම සම්පත් ලැබීමට නිසැක ලෙසම හේතුවන මහා කුසලයක් වන හෙයිනි.

එපමණක් නොව, මහා සංඝයා වහන්සේට යැපීමට ඥාතීන් වෙනුවෙන් දෙන ලද දානය උපකාරයකි. උන්වහන්සේලා රැකෙන්නේ - ජීවත්වන්නේ සැදැහැවත් ජනී ජනයාගෙන් ලැබෙන සිවුපස දානය නිසා ය. එසේ නොලැබුනහොත් තම යැපීම පිණිස විවිධ කටයුතුවල යෙදෙන්නට සිදුවෙති. ගොවිතැන් - වෙළ හෙළඳාම් - කර්මාන්ත ආදිය කරන විට උන්වහන්සේලාට පැවිදි බවට අයත් කටයුතු වල නැත්නම් බණ භාවනාදිය නිසි පරිදි සිදුකර ගැනීමට නොහැකි වන්නේ ය. සඟ සසුන පවතින්නේ

සැදැහැවතුන්ගේ උපකාරය සංසයාට ලැබෙන තාක් කල් ය' යන්න මෙම ගාථාවේ තුන්වෙනි පදයෙන් පැහැදිලි කරයි.

එසේම අප කාටත් පින් උවමනා කරති. අපි කරන කියන මේ සෑම හයි හපන්කමක්ම රැඳී පවතින්නේ පෙරපිනක බලය නිසා ය. මහත් වූ සැදැහැ සිතකින් යුතුව කුසල ක්‍රියාවන් කරන විට ඒ පිරිනමන ආහාරපානමය දානය තුළින් කරුණු පහක් පූජා කෙරෙති. ඒ කාරනා පහ නම්, ආයුෂය - වර්ණය - සැපය - බලය - ප්‍රඥාව යන කරුණුය. ඊට හේතුව අපි ජීවත් වන්නේ කෑම බීම නිසා ය. නැත්නම් ආහාරපාන නිසා ය. අපගේ ශරීරයේ පැහැය - පෙනුම නිසි පරිදි ලබාදෙන්නේ කන බොන දේ නිසා ය. නිරෝගිතාවය නමින් දක්වෙන ශරීර සැපය ලබාදෙන්නේත් ආහාරයෙනි. එසේම ශරීර ශක්තියද - ධන ශක්තියද උපනුපන් කවර තැනකදී වුවද අපට ලබාදෙන්නේත් ආහාර පූජාව නිසා ය. ප්‍රඥාව නමින් දක්වෙන බුද්ධිය එනම්, නැණනුවන ලබාදෙන්නේ ද ආහාරය නිසා ය. තුන් හතර දවසක් ආහාර පාන නොලැබුනහොත්, අප කොයිතරම් ඉහත කී කාරනා පහෙන් පිරිහෙනවාද යන්න අමුතුවෙන් කිවයුතු නොවේ. සැකෙවින් කියතොත් පිටපිට දින හත අටක් මේ ශරීරයට ආහාරපාන නොලැබුනහොත් අභාවයට පත්වීම වළක්වාලිය නොහැකිම ය. මේ අනුව ආහාරයෙන් තොරව අපට ජීවත්විය නොහැකි බව පෙනේ.

මියගිය අයටද එනම්, පරදත්තුපජීවී භූතලෝකයටද දෙවත්වයට පත්වීම සඳහා මෙකී කාරණා පහ ලැබිය යුතුම ය. ආයුෂය, වර්ණය ආදී ඒ කාරණා පහ ලබාදෙන්නේ ආහාරයෙනි. ආහාර පූජාවෙන් ඔවුන් සැපවත් කළ හැක්කේ එනිසා ය. වස්ත්‍ර පූජාවෙන් ඒ මියගිය අයට වස්ත්‍රාදියද ලබාදිය හැකි ය. මේ දන්දීමේදී දක්වාලිය යුතු සුවිශේෂ කරුණක් තිබේ. දානයක ආනිසංස වැඩිවන්නේ ලබන පුද්ගලයන් තුළ පවතින සීලාදි ගුණ - කරුණා - මෛත්‍රී ආදී ගුණ පවතින තරමට ය. සිල්වත් ගුණවත් භික්ෂූන් වහන්සේලාටම දන්දීමට කවුරුත් කැමති වන්නේ මේ ධර්මතාවය අනුවම ය. පුද්ගලයන් වශයෙන් ගත්විට මේ ලෝකයේ ඉහලම පිනක්

ලැබෙන්නේ ලොවුතුරා බුදුබවට පත් උන්වහන්සේ ශීල - සමාධි - පඤ්ඤා - විමුක්ති - විමුක්ති ඤාන දර්ශන යන උත්තරීතර ගුණයන්ගෙන් පරිපූර්ණ උත්තමයෙකු නිසා ය. පසේ බුදු කෙනෙකුන්ට පිදෙන දානය ඊළඟට උසස් ආනිසංසයක් ලබාදෙන පුන්‍යකර්මයකි. රහතන් වහන්සේ නමකට දෙන දානයෙන් ලැබෙන්නේ ඉන් අඩු උසස් ආනිසංසයකි.

බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ කොට මහා සංඝයාට දෙන දානය මහත්පල මහානිශංස වන්නේ ය. මේ පිලිබඳ විස්තර දක්ඛිනා විභංග සූත්‍රයේ දක්වා ඇත. ලබන පුද්ගලයන්ගේ උදාර ගුණත්, දෙන පුද්ගයන් තුල පවත්නා ශීලාදි ගුනත් පූජාකරනදේ දැහැමින්, අසාදාරනයෙන් හම්බනොකල දෙයකින්ම පූජා කිරීමත් දානයක ආනිසන්ස වැඩීමට හේතුවන බව සැලකිය යුතුය. මෙසේ ධාර්මිකව දන්දීමෙන් දිව්‍ය මනුෂ්‍ය සැප සසර වසන තුරුම ලබාගත හැකි ය. මෙම පුණ්‍යබලයෙන් මට නිවන් සැපත ලැබේවායි ප්‍රර්ථනා කිරීමෙන් නිවනට දානමය කුසලය යොමුකර ගත හැකි ය.

## සතුන්ට පිංදීම

මියගිය ඥාතීන්ට පිංදීම පිළිබඳව කරුණු දක්වන විට මේ කාරනයද අත්හල නොහැකි ය. තමන්ගේ කීකරු අලිඇතුන්, ගව, මහීෂාදි සතුන්ටද බලු, බළල් ආදී සතුන්ටද සමහර කෙනෙක් පිං අනුමෝදන් කරති. ඔවුන් තිරිසන් ගතව හිද අපි දෙන පින අනුමෝදන් වෙත්දැයි කෙනෙකුට සැකයක් පහලවිය හැකි ය. එයට හේතුව තිරිසන් අපායට වැටුනු කෙනෙකුට පිං ගැනීම අපහසු යැයි ඉහතදි දක්වා ඇති හෙයිනි. ඒ කාරණයෙහි වෙනසක් නැත. එහෙත් අපගේ නිවසක සිටිය කීකරු සතා ජීවත් වූයේ තිරිසන් අපායේ බව සත්‍යයකි. ඔහු මැරී පින්ගැනීමට හැකියාවක් ඇති පරදත්තූපජීවි ප්‍රේතබවයට වැටෙන්නත් පුළුවන එවිට අපි දුන් පිං අනුමෝදන්ව ඒ සතා දෙවත්වයට පත්විය හැකි ය. එයට හේතුව ඒ ඇතා, ගවයා, සුනඛයා, බළලා නැත්නම් වෙනත් සතෙක් අපේ අශ්‍රය නිසා ගුණවත්ව අපසමඟ පුන්‍ය කටයුතුවලද යෙදී ඇති නිසා ය. ඔවුහු තිරිසන් බවයෙන් චුත

වී පෙර අප සමග ජීවත්වෙද්දී කරුණා මෛත්‍රී ගුණ ඇතිව සිටි සතෙකු බැවින් පරදත්තූපජීව බවයට වැටෙන්නට පිලිවන එවිට අපි පිනක් දුන්නොත් වහා ඒ පින ලබා බලවත් සැපතකට පත්වීම ධර්ම නියාමයයි. මේ පින් අනුමෝදන් වන්නට නොහැකි වන්නේ තිරිසන් අත්මයේ සිටින විට ය. එසේ නැතත් තිරිසන් අත්ම වලින් මිදුනු බොහෝ සත්වයන්ට තමන් පෙර බවයන්හිදී සිදුකරගත් පින නිසා මනුෂ්‍යලෝක දිව්‍ය ලෝක වලද උපත ලැබිය හැකිය. කර්ම නියාමය එයයි. මෙහිදි දැක්විය යුතු විශේෂ කරුණක් ඇත කවර කෙනෙක් පිං ගත්තද නොගත්තද දානාදී පින්දහම් කළවිට එයින් අපට අතිමහත් කුසලයක් ලැබෙන බවයි.

තවද ප්‍රශ්නයකි. නිවෙස්වල මියගිය ඥාතින්ට පිංදීම සුදුසු දැයි සමහරු විමසන අවස්ථා බොහෝය. ගෙදර දොරේ උදේ සවස මල්පහන් පිදීමෙන් ලැබෙන පින ඥාතීන්ට අනුමෝදන් වීමට ප්‍රමානවත් නැත. ඒ නිසා එම කාරණය පාදක කොට ගෙන නිවෙස්වල පිංදීම නුසුදුසු යැයි මතයක් ඇති වී තිබේ. විශේෂයෙන්ම මියගිය අයට අවශ්‍ය වන්නේ ආයුෂ වර්ණ ආදී කාරණා පහ ලැබෙන පුණ්‍ය ක්‍රියාවන්ගෙන් ලැබෙන පිනම ය. ගෙදර දොරේ සඟසතු දානමය පුණ්‍යකර්ම සිදුකර නැතිබැරි අයට සංග්‍රහ කිරීමෙන් ලබාදෙන පින් මියගිය ඤාතී ප්‍රේතයන්ට අනුමොදන් විය හැකිය. ඒ නිසා ගෙදරදොරේ සිට පිංදීම නිවරදිව කළයුත්තකි. මියගිය අයට පිංදීම ඥාති සංග්‍රහයකි. තමන්ටද මෙලොව වශයෙන් රැකවරනයක් ලැබෙන්නකි.

මෙතෙක් දැක්වූ කරුණු ගැන බුද්ධිමත් ලෙස සැලකිලිමත් වීමෙන් මියගිය ඥාතීන් වෙනුවෙන් පිං අනුමෝදන් කළ යුතුය. මේ පිලිබඳ තව බොහෝ කරුණු ලිව යුතුව තිබුනද ඉතා සංක්ෂිප්ත ලෙසම මෙම පොත සකස් වී ඇති බව කරුණාවෙන් සලකත්වා.

**භව කතරින් එතෙර වීමට ඇවැසි මනා සිහිණුවනත් නිරෝගීභාවයත් ලැබේවා යන අධිටනින් යුතුව ධර්ම දානය පිණිස මුද්‍රණය කරවන ලදී.**

**2017 ජනවාරි මස**